# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2369/40 – 2024 පෙබරවාරි මස 02 වැනි සිකුරාදා – 2024.02.02

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: IR/COM/02/B/2015/02.

### කාර්මික ආරාවුල් පනත - 131 වන අධිකාරය

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2020.11.15 දිනැති හා අංක 2203/21 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2020.10.20 වැනි දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් කළගෙඩිහේන, හල්ගම්පිටිය, අන්නාසිවත්ත, අංක 8/4 ඒ හි පදිංචි ආර්. පී. ආනන්ද සාගර මයා සහ කොළඹ 01, චෛත්‍ය පාර, අංක 19 හි පිහිටි ශ්‍රී ලංකා වරාය අධිකාරිය අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත්කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති අංක A60/2020 හා 2023.12.28 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත්කරනු ලැබේ.

එච්. කේ. කේ. ඒ. ජයසුන්දර,
කම්කරු කොමසාරිස් ජනරාල් (රා. ආ.)

2024 ජනවාරි මස 19 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.




*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

බේරුම් කිරීමේ අංශය හා කාර්මික අධිකරණයේ දී ය.

නඩු අංකය: ඒ/60/ 2020.
1R /COM/02/B/2015/02.

ආර්. පී. ආනන්ද සාගර මයා,
අංක 8/4 ඒ,
අන්නාසිවත්ත,
හල්ගම්පිටිය,
කලගෙඩිහේන.

*පළමු පාර්ශ්වය*

සහ

ශ්‍රී ලංකා වරාය අධිකාරිය,
අංක 19,
චෛත්‍ය පාර,
කොළඹ 01.

*දෙවැනි පාර්ශ්වය*

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර පවත්නා කාර්මික ආරාවුල.

ප්‍රදානය

කම්කරු අමාත්‍ය නිමල් සිරිපාල ද සිල්වා මැතිතුමා විසින් 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 සහ 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල්) (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා එකී අංක දරන පනත්වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණ පනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4 (1) වගන්තියෙන් ඔහු වෙත පැවරී ඇති බලතල අනුව එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් හෝකන්දර උතුර, අරංගල, රණමයුර මාවත නො. 453F හි පදිංචි විතාරණගේ ජයරත්න වන මා වෙත 2020 ඔක්තෝබර් 20 දිනැති ව යොමු කර ඇත.

ආරාවුලට තුඩුදුන් කරුණු-

කම්කරු කොමසාරිස් ජනරාල් ඒ. විමලවීර මහතාගේ 1R /COM/02/B/2015/02 අංකයෙන් සහ 2020 ඔක්තෝබර් 13 දිනැති යොමුව අනුව ඉහත කී කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණු වනුයේ,

'' ශ්‍රී ලංකා වරාය අධිකාරියේ ආරක්ෂක නියාමකවරයෙකු ලෙස 1987.02.10 දින සිට සේවය කරන ආර්. පී. ආනන්ද සාගර මහතා 2008.05.05 දින සේවා නිමා වී ඔහුට අයත් වාහනයෙන් තමා ඇතුළු 04 දෙනෙකු සේවා ස්ථානයෙන් පිටව යාමේදී එම වාහනයේ අනවසර භාණ්ඩ තිබී සොයා ගැනීම සම්බන්ධයෙන් 01 අයෙකු ඉවත් කර 3 දෙනෙකුට පමණක් අභ්‍යන්තර විනය පරීක්ෂණ පවත්වා දෙදෙනෙකුට නැවත සේවය ලබාදී පැමිණිලිකරු පමණක් සේවයෙන් ඉවත් කර ඇති අතර එම සිද්ධියටම අදාළව පැමිණිලිකරු ඇතුළු තුන්දෙනෙකුට කොළඹ ප්‍රධාන මහේස්ත්‍රාත් අධිකරණයේ පැවරූ නඩුවෙන් චූදිතයන් 03 දෙනාම නිදොස් කොට නිදහස් කිරීමෙන් පසුව හෝ පැමිණිලිකරුට පමණක් නැවත සේවය ලබාදීමට සේවා යෝජක පාර්ශ්වය කටයුතු නොකිරීමෙන් පැමිණිලිකරුට අසාධාරණයක් සිදුවී ඇද්ද යන්න සහ එසේ නම් ඔහුට හිමිවිය යුතු සහන කුමක්ද යන්න පිළිබඳව වේ.'' යනුවෙන් සඳහන්ව ඇත. ඊට අදාළව පළමු පාර්ශ්වය වන ආර්. පී. ආනන්ද සාගර යන අය 2021. 03. 25 දින නීතිඥ පොඩිනිලමේ මහතා මඟින් ඉදිරිපත් කළ සිය පළමු ප්‍රකාශය ගොනුකර ඇත. මහේස්ත්‍රාත් අධිකරණ තීන්දුව ඇමුණුම 1 ලෙසත් චෝදනා පත්‍ර 1 සහ 2 ඇමුණුම් 2 ලෙසත් සේවය අවසන් කිරීමේ ලිපිය ඇමුණුම් 3 ලෙසත් වරාය අධිකාරියේ චෝදනා පත්‍රය ඇමුණුම් 4 ලෙසත් ඉදිරිපත් කර ඇත. ඉහත චෝදනා පත්‍රය සමග මොහොමඩ් පස්කින් ඉස්ලාම් නැමති අයෙකුගේ පොලිස් පැමිණිල්ලක් සමග බද්දෙගෙදර සමරරත්න යන ආරක්ෂක නිලධාරියාගේ පොලිස් පැමිණිල්ලක් අනුව අංක 27633/06 නඩුව මහේස්ත්‍රාත් අධිකරණයේ ගොනුකර ඇත. ඒ සමගම ආනන්ද සාගර යන අයට ලබාදී ඇති චෝදනා පත්‍රය ද ඉදිරිපත් කර ඇත. ඉන් අනතුරුව 2021.05.25 දින ආර්. ඩබ්. ඇම්. පොඩිනිලමේ නීතිඥ තැන මාර්ගයෙන් බේරුම්කරණය වෙත පළමු ප්‍රකාශය වශයෙන් ලිඛිත දේශනයක් ඉදිරිපත් කර ඇත. ඒ සමග පැ 01 වශයෙන් මහේස්ත්‍රාත් අධිකරණයේ චෝදනා පත්‍රය, පැ 02 මහේස්ත්‍රාත් අධිකරණයේ තීන්දු ප්‍රකාශය, පැ 03 වරාය අධිකාරියෙන් දුන්න චෝදනා පත්‍රය, පැ 04 සේවය අවසන් කිරීමේ ලිපිය සහ ඇමුණුම් 01 වශයෙන්, පැ05 වරාය අධිකාරියේ විනය නීති මාලාව යන ලේඛන ඉදිරිපත් කර ඇත.

ඉහත සිද්ධියට අදාළව කොළඹ මහේස්ත්‍රාත් අධිකරණයේ පැවැති 27637/06 නඩුවෙන් චූදිතයන් තිදෙනාම නිදොස් කොට නිදහස් කර ඇති බවත් එහෙත් වරාය අධිකාරිය විසින් පැවැත්වූවා යැයි කියනු ලබන විධිමත් විනය පරීක්ෂණයට අනුව ආර්. පී. ආනන්ද සාගර යන අය සියලු චෝදනාවන්ට වැරදිකරු බව තීරණය කර 2009.02.18 දින ඔහු පමණක් සේවයෙන් ඉවත් කර ඇති බවත්, ඔහු විසින් ප්‍රකාශ කරනු ලැබ ඇත.

වරාය තුළදී මෙම නඩුවට අදාළ භාණ්ඩ සහ විත්තිකරුවන් (ආරක්ෂක නියාමකයන්) රැගෙන ආ ආනන්ද සාගරගේ වාහනය සහ එහි තිබූ භාණ්ඩ ආරක්ෂක නියාමක විශේෂ විමර්ශන අංශය මගින් පරීක්ෂා කර සැක සහිත භාණ්ඩ සමග එහි ගමන්ගත්

01. ආර්. පී. ආනන්ද සාගර - වාහනයේ හිමිකරු සහ රියදුරු
02. දිමුතු ප්‍රසන්න බඹරුන්ද - වරාය ආරක්ෂක
03. සම්පත් ප්‍රියන්කර - වරාය ආරක්ෂක
04. ධර්මරත්න - නියෝජිත ප්‍රධාන ආරක්ෂක කළමනාකරුගේ රියදුරු

වාහනයේ ගමන් ගත් අතර ඉහත සිව් දෙනා අතරින් නියෝජ්‍ය ප්‍රධාන ආරක්ෂක කළමනාකරුගේ රියදුරු හැර සෙසු තිදෙනා පමණක් විත්තිකරුවන් ලෙස නම් කර නඩු පවරා ඇත. අත්අඩංගුවට ගන්නා අවස්ථාවේ එකී වාහනයේ සිටි නියෝජ්‍ය ආරක්ෂක කළමනාකරුගේ රියදුරු එතනදීම කිසිදු වගවිභාගයකින් තොරව නිදහස් කර යවනු ලබන අතර අවම වශයෙන් ඔහු මෙම නඩුවේ සාක්ෂිකරුවකු වශයෙන් හෝ නම්කර නැති බවද, සාක්ෂි අනුව තහවුරු වී ඇත.

එකී නිදහස් කළ අය CFX 1 ගුදම ආසන්න ප්‍රදේශයේ එනම්, මෙම නඩුවේ විත්තිකරු රාජකාරී කරන ලද ස්ථානය ආසන්නයේම සිට ඇති අතර ඔවුන් සේවය අවසන් කර නික්ම යාමේදී එම ගුදමේ ම පිටත ආසන්න තැනකදී සහකාර ආරක්ෂක කළමනාකරුගේ රියදුරු තැනද අදාළ වාහනයට ගොඩවීමත් අත්අංගුවට ගන්නා අවස්ථාවේදී සෙසු තිදෙනා පමණක් අත්අඩංගුවට ගෙන ඔහු එතනදීම නිදහස් කර හැරීමත් මෙම ක්‍රියාවලියේදී දෙවන පක්ෂයේ සාධාරණත්වය පිළිබඳව සැක දනවන කරුණක් බව නිරීක්ෂණය වේ.

කෙසේ වෙතත් දෙවන පක්ෂය විසින් මෙම බේරුම්කරණයේ දී ද, එය විභාගයට ගැනීම වළක්වා ගැනීම සඳහා මූලික විරෝධතාවයක් ගොනුකරන ලදි. මෙම නඩුවේ දී මෙන්ම මහේස්ත්‍රාත් අධිකරණ නඩුවේදී ද දෙවන පක්ෂයේ නීති අංශව පැහැදිළිව පෙනී යන අතපසුවීම් ගණනාවක් කර ඇති බැවින් සහ එකී මූලික විරෝධතා සාධරණ සේ පෙනී නොයන හෙයින් පහත සඳහන් පරිදි එකී විරෝධතා ප්‍රතික්ෂේප කර මෙම බේරුම්කරණ නඩුව විභාග කිරීමට තීරණය කළෙමි. ඉහත කී මූලික විරෝධතාවයන් වන්නේ

(අ) 2008.05.05 වන දින ඉහත පළමු පාර්ශ්වය ඇතුළු අනිකුත් සේවකයන් විසින් සිදුකරනු ලැබූ විෂමාචාර සම්බන්ධයෙන් සියලු චූදිතයන්ට සමාන චෝදනා පත්‍ර ගොනුකර නැති බවයි.

සමාන චෝදනා නැති බව සත්‍යයකි. එහෙත් චෝදනා ගොනු කර ඇති ආකාරය සාධාරණ නොවන බව බැලූ බැල්මට පෙනී යන කරුණකි. චූදිතයන් අත්අඩංගුවට ගන්නා අවස්ථාවේදීම අදාළ වාහනයේ සිටි 4 දෙනාගෙන් ප්‍රධාන නියෝජ්‍ය ආරක්ෂක කළමනාකරුගේ රියදුරුද අදාළ භාණ්ඩ සොරකම කලායැයි කියන CFX 1 ගුදමේම අභියස ආසන්න තැනකදී ආනන්ද සාගර යන අයගේ වාහනයේ සෙසු විත්තිකරුවන් සමග පැමිණ ඇති අතර අත්අඩංගුවට ගැනීමට කටයුතු කළ ස්ථානයේදීම ඔහු පමණක් නිදහස් කර යවන අතර සෙසු සියලු දෙනාටම විරුද්ධව චෝදනා ගොනු කර ඇත්තේ එකම ආකාරයටයි. පළමු පක්ෂය විශේෂ වන්නේ ඔහුගේ වාහනය ඔහුට හිමිවීම පමණි. එසේම ප්‍රධාන නියෝජ්‍ය ආරක්ෂක කළමනාකරුගේ රියදුරුට එම ප්‍රදේශයේ පැවැති රාජකාරිය ද පැහැදිළි කර නැත. එම නඩුවේ සාක්ෂිකරුවකු වශයෙන් හෝ ඔහු යොදා නොගෙන සඟවා තබා ගැනීමට තිබුණ අවශ්‍යතාවයද පැහැදිළි කර නැත. මහේස්ත්‍රාත් අධිකරණය ද තීන්දුව ලබාදීමේදී මෙම තත්වය සැළකිල්ලට ගෙන තිබේ. ඒ අනුව එම විරෝධතාවය ප්‍රතික්ෂේප කරමි.

(ආ) විරෝධතාවයේ සඳහන් මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු කටයුත්ත අවසන් වීමෙන් පසුව අදාළ විධිමත් විනය පරීක්ෂණය කර නැති බව දක්වා ඇත. එසේම සියලු ස්වභාවික යුක්ති මූලධර්මවලට අනුකූලව එම පරීක්ෂණය සිදු කර ඇති බව දෙවන පක්ෂය වැඩිදුරටත් දක්වයි. එහෙත් එකී කරුණ ද සාධාරණව කර ඇති බවක් තහවුරු වි නැත. අත්අඩංගුවට ගන්නා අවස්ථාවේ අදාළ වාහනය තුල සිටි තිදෙනෙක්ට නඩු පවරා එක් අයෙක් නිදහස් කිරීම සහ හොඳම සාක්ෂිය වන ඔහු සාක්ෂියක් වශයෙන් හෝ නොකැඳවීම තුලින් අසාධාරණයක් කර ඇති බවට සාධාරණ සැකයක් බැලූ බැල්මට පෙනී යන හෙයිනි. එම රියදුරු ප්‍රධාන නියෝජ්‍ය ආරක්ෂක කළමනාකරුගේ රියදුරු වීම සහ අත්අඩංගුවට ගැනීම මෙහෙය වූ නිලධාරියා වන්නේද ඔහු වීම හේතුවෙන් ඒ පිළිබඳව ප්‍රබල සැකයක් ඇති කරයි. ඔහු සාක්ෂිකරුවකු වශයෙන් හෝ ඉදිරිපත් කර නැත්තේ හරස් ප්‍රශ්න වලට භාජනය වීම වළක්වා ගැනීමේ ක්‍රියාමාර්ගයක් ද යන සැකය ද ඇතිවන අතර මෙම වැටලීම ඔහුගේ රහස් සැලැස්මකට අනුව කර ඇති බව අවස්ථානුගත තත්වයන් සැලකීමේ දී සාධාරණ පුද්ගලයාගේ සංකල්පයෙන් බලන කල පැහැදිළි වේ. ඒ අනුව එය ද ප්‍රතික්ෂේප කරමි.

(ඇ) දෙවන පාර්ශ්වය විසින් පළමු පාර්ශ්වයට පවත්වනු ලැබුවායයි කියනු ලබන විධිමත් විනය පරීක්ෂණය සියලු ස්වභාව යුක්ති මූලධර්මයන්ට අනුකූලව සිදුකර ඇති බව ඔවුන් විසින් පුනපුනා ප්‍රකාශ කර ඇත. එහෙත් ඒ බව තහවුරු කිරීමට කිසිම සාක්ෂියක් ඉදිරිපත් කර නැත. ඉහත කී හොඳම සාක්ෂිය වන ප්‍රධාන නියෝජ්‍ය ආරක්ෂක තැනගේ රියදුරු වාහනය පරීක්ෂා කරන අවස්ථාවේදීම නිදහස් කර හැරීමත්, ඔහුට එහි පැවැති රාජකාරියක් පැහැදිළි කර නැතිවීමත්, ඉන්පසුව ඔහු සඟවා තබා ගැනීම සහ සාක්ෂියක් ලෙස හෝ යොදා නොගැනීම යන කරුණු හේතුවෙන් ම දෙවන පක්ෂයේ ක්‍රියාකලාපය පිළිබඳව සාධාරණ සැකයක් ඇති බන බව පෙනී යයි. මහේස්ත්‍රාත් අධිකරණයේ විනිසුරුතුමා විසින්ද මේ තත්ත්වය සැලකිල්ලට ගෙන තිබේ.

එසේම දෙවන පක්ෂය පුනපුනා ප්‍රකාශ කරන සහ ඔවුන්ගේ ක්‍රියා කලාපය සාධාරණීකරණය කිරීමට ඇති එකම සාක්ෂිය විධිමත් විනය පරීක්ෂණය කළ බව. තහවුරු කිරීමට අදාළ ගොනුව හෝ එහි පිටපතක් හෝ තීන්දුව හෝ කිසිම අවස්ථාවක මෙම පරීක්ෂණය සඳහා ඉදිරිපත් කර නැත. ඒ පිළිබඳව පුනපුනා ප්‍රකාශ කරන දෙවන පක්ෂයට එවැනි පරීක්ෂණයක් කිරීම තහවුරු කිරීමට කිසිදු ලේඛනයක් ඉදිරිපත් කිරීමට හෝ විධිමත් සාක්ෂියක් මගින් තහවුරු කිරීමට හැකිවී නැතිබව විමර්ශනයේදී තහවුරු වී ඇති බව පෙනේ. "347 වන පිටුව 5 වන ප්‍රශ්නය (පළමු පක්ෂයෙන් අසන ලද දෙවන පක්ෂයේ හරස් ප්‍රශ්න)''

ප්‍ර : විධිමත් විනය පරීක්ෂණයක් තිබුණා කියන එක තමා පිළිගන්නවා නේද?

පි : පරීක්ෂණයක් තිබුණා
විධිමත් බව පිළිගෙන නැත

ප්‍ර : අභ්‍යන්තර විනය පරීක්ෂණයට තමා එකඟ නැතිනම් තමාට තිබුණා වරාය අධිකාරියට අභියාචනයක් කරන්න

පි : ඔව්

ප්‍ර : තමා එසේ අභියාචනයක් කලාද?

පි : එහෙම එකක් මම දැනගෙන සිටියේ නැහැ

නීතිය නොදැනීම සමාවට කරුණක් නොවේ යන්න පිළිගත් සිද්ධාන්තය අනුව පළමු පක්ෂයට සමාවක් නැතත් ඔහුගේ නොදැනුවත් කම යොදාගෙන අකටයුත්තක් කලාද යන්න නොසලකා හැරිය හැකි තත්ත්වයක් නොවන බව ඉහත තත්ත්වය මත සලකා බැලිය යුතු කරුණක් බවට තීරණය කරමි. සලකා බලමි. වාහනයේ පැමිණීම පිළිබඳව ඇතැම් ආරක්ෂක නිලධාරීන් ක්‍රෝධයෙන් සිටි බව සාක්ෂි අනුව පෙනීයයි. ඒ අනුව වාහනය කොටු කිරීම සමස්ථ ක්‍රියාවලියේ අරමුණද? යන සැකය ද නොසළකා හැරිය හැකි තත්වයකි.

එසේම ඔහු දැනුමින් සන්නද්ද කපටි පුද්ගලයෙක් නොවන බවද පෙනී යයි. වාහනයේ අයිතිකරු ඔහු බැවින් සම්පූර්ණ වගකීම ඔහුගේ කරමත පැටවී ඇති බව සමස්ථ සාක්ෂි අනුව පැහැදිළි වේ. එසේම මෙම වැටලීම කර ඇති ආකාරය අනුව වාහනය කොටු කිරීම ඔවුන්ගේ අරමුණ වී ද යන සැකයද උද්ගත වේ. කලා යැයි කියනු ලබන විධිමත් විනය පරීක්ෂණය කළ පුද්ගලයා වරායේම ආරක්ෂක අංශයේ අධිකාරිවරයෙක් වන කේ. ඩී. චන්ද්‍රපාල මහතා විසින් සිදුකර ඇත. ඔහු ද ආරක්ෂක අංශවලට අදාළව කටයුතු කරන නිලධාරියෙකි. ඒ අනුව ස්වාධීන විනය පරීක්ෂණයක් කලාය යන සංකල්පය ද මුලුමනින් බිඳවැටී ඇති බව බැලූ බැල්මට පෙනේ. " NEMO JUDES CAUSA SUA" යන තත්වය මෙහිදී අදාළ වේ. ඒ අනුව ද අසාධාරණයක් වී ඇති බව පෙනේ. එසේම මෙම පරීක්ෂණයේදී ඒ පිළිබඳව නීතිමය තත්වය සහ එහි බලවත්භාවය පිළිබඳව පුන පුනා කතා කල දෙවන පක්ෂයේ නීති අංශය විනය පරීක්ෂණයක් කළානම් තම ක්‍රියාකලාපය සාධාරණීකරණය කිරීමට ඇති එකම සාක්ෂිය වන එකී පරීක්ෂණයේ තීන්දු ප්‍රකාශය හෝ අවම වශයෙන් ගොනුව හෝ මෙම පරීක්ෂණයට ඉදිරිපත් කල යුතුව ඇත. සාක්ෂි අනුව එවැනි ගොනුවක් නැති බව පෙනී යයි. දෙවන පක්ෂයේ සාක්ෂිකරුවකු වූ හර්ෂණ යන අයගේ සාක්ෂියේදී තහවුරු වූයේ එම ගොනුව කම්කරු උසාවියේද යන්න නොදන්නා බවයි. එය ද පිළිගත නොහැක්කේ. කල්පමාවී ඉදිරිපත් කිරීම මත සහ ඉල්ලුම්කරුගේ ඉල්ලා අස්කර ගැනීම හේතුවෙන් එම නඩුව ප්‍රතික්ෂේප කර ඇති බැවිනි. එකී කම්කරු උසාවි නඩුව කල්පමාවී ඉදිරිපත් කිරීම මත විභාගයට නොගෙනම ඉල්ලා අස්කර ගැනීම හේතුවෙන් නිෂ්ප්‍රභා කර ඇත. ඒ අනුව විධිමත් විනය පරීක්ෂණ ගොනුව එයට ඉදිරිපත් කිරීමේ අවශ්‍යතාවය පැන නොනගින බව තහවුරු වේ. ඒ අනුව පෙනී යන්නේ වරාය අධිකාරියේ පරිපාලනය සහ නීති අංශයේ නොසැළකිලිමත් ස්වභාවයයි.

කෙසේ වෙතත් දෙවන පක්ෂය මෙම බෙරුම්කරණයට ගොනුකර ඇති පළමු ප්‍රකාශයෙන්ම මූලික විරෝධතාවයක් ගොනුකර තිබුණි. ඒ සම්බන්ධයෙන් 2022.09.20 දින බේරුම්කරණයෙන් නියෝගයක් නිකුත් කර ඇති අතර මූලික විරෝධතාවයේදී මූලික වශයෙන් සඳහන් කර ඇත්තේ කම්කරු විනිශ්චය අධිකාරියෙන් ප්‍රතික්ෂේප කල නඩුවක් සම්බන්ධයෙන් බේරුම්කරණයට පැමිණ ඇති හෙයින් එම නඩුව පවත්වාගෙන යාමට බේරුම්කරණයට බලතල නැති බවයි. මෙම බේරුම්කරණය මා වෙත යොමුකර ඇත්තේ කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තියෙන් වන අතර එය තීරණය කරනු ලබන්නේ කම්කරු ඇමතිවරයා සතු බලතල අනුව වේ. කම්කරු කොමසාරිස් ජනරාල් විසින් යොමු කිරීම කර ඇත. ඒ සම්බන්ධව කාලාවරෝධවයක් දක්වා නොමැති අතර කම්කරු විනිශ්චය සභාවට යොමු කිරීමට අදාළ කාලය තුළ නඩු ගොනු නොකිරීම මත එම නඩුව ඉල්ලා අස්කර ගෙන ඇති බව තහවුරු වේ. එම නීති තත්වය

බේරුම්කරණයට අදාළ නොවන හෙයින් දෙවන පක්ෂයේ මූලික විරෝධතාවය ප්‍රතික්ෂේප කර මෙම නඩුව පවත්වාගෙන යාමට තීරණය කරමි. මෙහිදී සලකා බලනු ලබන්නේ අසාධාරණයක් සිදු වී තිබේ ද? තිබේ නම් ලැබිය හැකි සහන කවරේද යන්න පමණි. නැවත රැකියාව නොවේ.

එසේම දෙවන පක්ෂයේ නීති අංශයේ දුර්වල පරිපාලනය සහ උපදේශනය හේතුවෙන් විධිමත්ව ලිපිගෙනු පවත්වාගෙන යාම හා නිවැරදි තීන්දු තීරණ ගැනීමක් සිදු වී නැති බව ද පෙනේ. ස්වාධීන විධිමත් විනය පරීක්ෂණය ආරක්ෂක අංශයේම සේවයේ නියුතු අධිකාරිවරයෙක්ට යොමු කිරීම හරහා ඒ බව මොනවට තහවුරු වේ. තමාගේ නඩුව තමා විසින්ම විසඳීම යන තත්වය මෙහිදී පැහැදිලිව සිදු වී ඇති බව පැහැදිලි වේ. එසේම මෙම නඩුව සඳහා කිසිම අවස්ථාවක විනය ගොනුව හෝ එහි තීන්දු ප්‍රකාශය ඉදිරිපත් කර නැත. ඔවුන්ගේම සාක්ෂි අනුව අදාළ ගොනුව තිබෙන තැනක්, නිශ්චිතව දන්නේ ද නැත.මෙම තත්වය ආයතනයේ අසංවිධානාත්මක බව හෙළිකරන අතර එසේ නොවන්නේ නම් ඔවුන්ගේ දුර්වලතාවයන් හෙළිදරවු වීම වළක්වා ගැනීම සඳහා එම නියෝගය සහ ගොනුව ඉදිරිපත් නොකරන බවට තීරණය කළ හැකිය. නොඑසේ නම් එවැනි පරීක්ෂණයක් කලාය යන්න අසත්‍යයක් විය යුතුය

වරාය වැනි සුපරීක්ෂාකාරීව කටයුතු කළ යුතු ස්ථානයක මෙවැනි වගකීම් විරහිතව අවිධිමත් කටයුතු කෙසේවත් සිදු නොවිය යුතුය. මෙම දුර්වලතා හේතුවෙන් ඔවුන් නොදන්නා හොරකම් සිදු විය හැකි බවට කරුණු නිරීක්ෂණය වේ. මෙම සිද්ධියට අදාළ වාහනයේ හිමිකරු පළමු පක්ෂය වීම මත සිද්ධියට අදාළ සම්පූර්ණ වගකීම ඔහු වෙත පවරා ඇති බව සමස්ථ සාක්ෂි අනුව පැහැදිලි වේ. වරාය අධිකාරියේ ඇතැම් නිලධාරීන්ගේ එකම අරමුණ එයද යන සැකය ද ඒ අනුව පැනනගී. මහේස්ත්‍රාත් අධිකරණයේ නියෝගය අනුව තහවුරු වන පරිදි ඔත්තුව ලද වේලාව අනුව නීති විරෝධී කටයුත්තක් වෙනවා නම් ක්ෂණික පියවර ගෙන එම ස්ථානයේදීම අල්ලා ගත හැකිව තිබුණි. ඊට අදාළව කිසිදු පියවරක් නොගෙන මග රැක සිට ඇල්ලීම පිළිබඳව ද සැක මතුවේ. එසේම තොරතුර ලද පුද්ගලයා වන්නේ ද නියෝජ්‍ය ප්‍රධාන ආරක්ෂක කළමනාකරුයි. ඔහුගේ රියදුරු අදාළ ගුදමටම නොදුරු තැනක සිට එම වාහන-යේම පැමිණීමත් අදාළ ගුදම ආසන්නයේ ඔහුට තිබූ රාජකාරිය පැහැදිලි නොකිරීමක් අතර මැද ස්ථානයකදී වාහනය පරීක්ෂා කිරීමක් එහිදී වාහනයේ පැමිණි නියෝජ්‍ය ප්‍රධාන ආරක්ෂක කළමනාකරුගේ රියදුරු කිසිදු වගවිභාගයකින් තොරව එම ස්ථානයේදීම නිදහස් කර හැරීමත් එහි සිටි රියදුරු ආනන්ද සාගර සමග සෙසු ආරක්ෂක නියාමකවරුන් ද අත්අඩංගුවට ගෙන නඩු පැවරීමත් යන කරුණු අනුව එම සැකය තවදුරටත් තහවුරු වේ. මෙම තත්වය මහේස්ත්‍රාත් අධිකරණයේ දී තීන්දුව ලබාදීමේ දී සලකා බලා ඇති අතර ඒ අනුව සියළුම චූදිතයන් නිදොස් කොට නිදහස් කර ඇත.

එසේම වරාය අධිකාරියේම ආරක්ෂක අංශයේ අධිකාරිවරයෙක් වන කේ. ඩී. චන්ද්‍රපාල මහතා ස්වාධීන විනය පරීක්ෂණය කළ බවට ඔවුන්ගේ ම සාක්ෂි අනුව තහවුරු වේ. ඒ අනුව ස්වාධීන විනය පරීක්ෂණයක් කලාය යන්න අසත්‍යයක් බව සනාථ වේ. කෙසේ වෙතත් කිසිම අවස්ථාවක විධිමත් විනය පරීක්ෂණයට අදාළව කරුණු ඉදිරිපත් කර නැති අතර ඒ අනුව කළ හැකි නිගමනය වන්නේ දෙවන පක්ෂයේ ස්ථාවරයට අවැඩදායි වීම මත එය ඉදිරිපත් නොකර කටයුතු කර ඇති බවයි.

"83 පිටුව''

පළමු පක්ෂයේ නීතිඥතුමා විසින් පළමු පක්ෂයෙන් අසා ඇත.

ප්‍ර : ඔබ මෙම ආයතනයේ රැකියාව කරන කාලයේ සිටි අය ඔබත් සමග අමනාපයෙන් සිටියා ද?
පි : "CFSI'' හිටපු සහකාර ආරක්ෂක නිලධාරි සහ සැරයන්වරයා ඉඳලා හිටලා මගේ වාහනේ යනකොට ඒ ගැන පොඩි ඊර්ෂියාවක් කැපිලි කෙටිලි වචන යොදනවා. එම නිසා මට තේරුම් ගිහිල්ලා සිටියේ ඒ ගැන පොඩ්ඩක් ක්‍රෝධයෙන් ඉන්නවා කියලා වාහනයක් පාවිච්චියක් කරන නිසා වෙන්න ඇති.''
ප්‍ර : ඒ අය තමන්ට විරුද්ධව අධිකරණයේ හෝ විනය පරීක්ෂණයේ සාක්ෂි දෙන්න පැමිණියා ද ?
පි : පැමිණියා.
ප්‍ර : කොහාට ද පැමිණියේ ?
පි : විනය පරීක්ෂණයට පැමිණියා ඒ දෙන්නා උසාවියට පැමිණියේ නැහැ.

57 පිටුව.

පළමු පාර්ශ්වයේ නීතිඥ තුමා අසන ලද ප්‍රශ්න

ප්‍ර : ඒ බඩු තමාගේ ද?
පි : නැහැ මගේ නොවේ.
ප්‍ර : තමන්ගේ වාහනය අගුලුදාලද තිබුනේ.
පි : නැහැ. ලොක් එක කැඩිලා තිබුනේ.

ආරක්ෂක අංශයේ විමර්ශන ඒකකයට ලබාදුන්න තොරතුර ලබාගෙන ඇත්තේ විශේෂ විමර්ශන ඒකකයේ කපිතාන් හර්ෂ වීරසූරියයි. (2008.05.05 දින )

විධිමත් විනය පරීක්ෂණය සම්බන්ධව පළමු පක්ෂයේ සාක්ෂි පැ 4 කැඳවීම් ලිපිය අනුව කැඳවා ඇත්තේ පරීක්ෂණ නිලධාරි, ආරක්ෂක අධිකාරි කේ. ජී. චන්ද්‍රපාල මහතා විසිනි. ඒ අනුව මෙම පරීක්ෂණය සාධාරණව කර තිබේ ද යන කරුණ මතුවන අතර පක්ෂග්‍රාහීව තීන්දු තීරණ ගෙන ඇතිබව පෙනී යයි. නියෝජ්‍ය ප්‍රධාන ආරක්ෂක කළමනාකරුගේ රියදුරු අත් අඩංගුවට ගන්නා තැනදීම නිදහස් කර යවා ඇති බව සාක්ෂි අනුව පැහැදිළිය.ඒ අනුව මෙම පරීක්ෂණය සාධාරණව කර තිබේ ද යන සැකය තිබෙන අතර පක්ෂග්‍රාහීව තීන්දු තීරණ ගෙන ඇති බවක් පෙනී යයි. මහේස්ත්‍රාත් නියෝගයේ සඳහන් පරිදි නියෝජ්‍ය ප්‍රධාන ආරක්ෂක තැනගේ රියදුරු සාක්ෂියක් වශයෙන් යොදා නොගැනීම සාක්ෂි ආඥාපනතේ 114 ඊ වගන්තිය මත අවැඩදායිවීම මත ඉදිරිපත් නොකළ බවට අනුමැතියක් කළ හැකි බවට පැහැදිළිව දක්වා ඇත. ආරක්ෂක නිලධාරි බද්දේගෙදර සමරරත්නගේ සාක්ෂිය අනුව, 320 පිටුව.

ප්‍ර : ඔය තුන්දෙනා විතරද ආවේ?
පි : නැහැ තව කෙනෙක් ආවා.
ප්‍ර : ඒගැන කීවේ නැහැනේද?
පි : (පිළිතුරු නැත) - වසන් කිරීමට කටයුතු කරන බව පැහැදිළි වේ.
ප්‍ර : කවුද අනිත් කෙනා ?
පි : ධර්මරත්න කියලා කෙනෙක්.
ප්‍ර : එයා කවුද?

321 පිටුව.

පි : රියදුරෙක්.

322 පිටුවේ 2 වන ප්‍රශ්නය

ප්‍ර : මම සාක්ෂිකරුට යෝජනා කරන්නේ මෙම පිරිස තමයි මෙහෙම නිර්නාමික ඇමතුමක් දුන්නේ කියලා?
පි : (පිළිතුරක් නැත නිහඬව සිට ඇත.)
ප්‍රතික්ෂේප කිරීමක්ද කර නැත

ඒ අනුව ඔහුට මෙම සිද්ධිදාමය පිළිබඳව යම්කිසි දැනුමක් තිබුණා ද යන සැකය උද්ගත වේ.

326 පිටුව අවසන් ප්‍රශ්නය

ප්‍ර : තිබුණ දේවල් මතක නැහැනේද?
පි : ප්‍රමාණ මතක නැහැ.

ඒ අනුව නඩුවට අදාළ භාණ්ඩ වාහනයේ තිබුණ බවට තහවුරුවක් ලැබුණත් නිශ්චිත තත්වයේ නොමැති බවට පෙනී යයි.

කෙසේ වෙතත් (328 වන පිටුව 3 වන ප්‍රශ්නය

ප්‍ර : ඔහු සතුව තිබුණා එහෙම ලේඛනයක් ඒ දුන්න ලේඛනය තමන්ලා භාරගත්තේ නැහැ?
පි : එහෙම තිබුණා නම් ඒ වේලාවේ පොලිසියට ඉදිරිපත් කරන්න තිබුණා. විනය පරීක්ෂණයට ඉදිරිපත් කරන්න තිබුණා. යනුවෙන් පිළිතුරු දී ඇත.

එබඳු ලේඛනයක් තිබුණා නම් එහිදී ඉදිරිපත් කළ ද භාර නොගත් එම ලේඛනය මෙම බේරුම්කරණ පරීක්ෂණයටද ඉදිරිපත් කළ හැකිව තිබුණි. නමුත් එසේ කර නැති බවක් පෙනී යයි.
ඒ අනුව පළමු පක්ෂය එකිනෙකට පරස්පර ද්විත්ව ස්ථාවරයක සිටි බව පෙනේ.

01. ලේඛනයක් සමග එම භාණ්ඩ ඔහු සතුව තිබුණ බව.
02. වෙනත් පිරිසක් විසින් තමාව අමාරුවේ දැමීමට මෙම භාණ්ඩ හොර රහසේ වාහනයට දමා ඇති බව.

ඒ අනුව පළමු පක්ෂය ද එක ස්ථාවරයක නැති බව පෙනී යයි. එහෙත් එසේ ලේඛනයක් තිබුණා නම් පළමු පාර්ශ්වය සහ ඔහුගේ නීතිඥ තැනට මෙම ලේඛනය මෙම පරීක්ෂණයට ලකුණු කිරීමට කිසිඳු බාධාවක් නොතිබුණි. එහෙත් එසේ කටයුතු කර නැත. මෙම නඩුවට අත්‍යවශ්‍ය ලේඛනයක් වන එම ලේඛනය ලකුණු කර ඉදිරිපත්කර නොතිබීම පළමු පක්ෂයේ අඩුපාඩුවක් බවට පෙනේ නැතහොත් පළමු පක්ෂය ගොතන අසත්‍යක් ලෙසද සැළකිය හැකිය. එය බේරුම්කරණයට ලකුණු කිරීමට කිසිදු බාධාවක් නැති ලේඛනයකි. පළමු පක්ෂයේ නිර්දෝෂීභාවය ඔප්පු කිරීමට වැදගත් වන ලේඛනයකි. ඒ අනුව එවැනි ලේඛනයක් තිබුණාය යන්න පිළිගැනීමේ හැකියාවක් නැති බවට තීරණය කරමි.

337 පිටුව ( විනය පරීක්ෂණයට අදාළව විමසීමේදී)

ප්‍ර : මම තමුන්ට යෝජනා කලොත් ඒ හිටියේ චන්ද්‍රපාල මහත්මයා කියලා තමුන්ගේ ආරක්ෂක කොට්ඨාසයේ?

පි : ඔව් හරි, එයා තමයි. (ආරක්ෂක අංශයෙන්ම විනය පරීක්ෂණය කළ බව ඒ අනුව තහවුරු වේ.)

337 පිටුවේ අවසන් ප්‍රශ්නය

ප්‍ර : චන්ද්‍රපාල මහත්මයා නේද තමුන්ගෙන් ප්‍රශ්න ඇහැව්වේ ?

පි : මට එහෙම මතක නැහැ.

ප්‍ර : ඒ අනුව කරුණු වසංකිරීමට උත්සාහ කරන බවක් පෙනේ. තමන්ට පුළුවන්ද සාධාරණ පරීක්ෂණයක් සිද්ධකලා කියන්න දැනුමක් තිබුණ ද?

පි : මට එහෙම දැනුමක් නැහැ.

කෙසේ වෙතත් දෙවන පක්ෂය පුන පුනා ප්‍රකාශ කරන විනය පරීක්ෂණ තීන්දුව කිසිදු අවස්ථාවක මෙම පරීක්ෂණයට ඉදිරිපත් කර නැත.

සමස්ථයක් වශයෙන් සලකා බලන කල ඉහත කරුණු අනුව පෙනී යන්නේ ඔවුන් මූලික වශයෙන්ම බර තබන විධිමත් විනය පරීක්ෂණයේ කරුණු තහවුරු කර නැති බැවින් මූලික විරෝධතා ප්‍රතික්ෂේප කර මා විසින් මෙම නඩුව විභාග කිරීමට තීරණය කරන ලදී.

සමස්ථයක් වශයෙන් සලකා බලන විට වරාය අධිකාරිය මූලික විරෝධතාවය හරහා සමස්ථ නඩුව අවසන් කර ගැනීමට උත්සාහ කළා විනා සාධාරණව එම නඩුව ඔප්පු කිරීමට විධිමත්ව පියවර ගෙන නැති බව පෙනී යයි. අවම වශයෙන් දෙවන පක්ෂය මූලිකවම බරතබන විධිමත් විනය පරීක්ෂණ ගොනුව හෝ එහි තීන්දුව කිසිදු අවස්ථාවක ඉදිරිපත් කිරීමට කටයුතු නොකිරීම හරහා ඔවුන්ගේ ස්ථාවරය තහවුරු කිරීමට මුළුමනින්ම අපොහොසත් වී ඇති බවට සනාථ වේ.

විධිමත් විනය පරීක්ෂණයක් ගැන දිගින් දිගටම ප්‍රකාශ කර ඇතත් වරායේම සේවයේ නියුතු ආරක්ෂක අංශයේ අධිකාරිවරයෙක් වන චන්ද්‍රපාල මහතා විසින් එය සිදුකළ බව ඔවුන්ගේම සාක්ෂි වලින් තහවුරු වී ඇත. ඒ අනුව එහි විධිමත් භාවයට සහ ස්වාධීනත්වයට හානි වී ඇති අතර අවැඩදායක වන බැවින් එය හිතාමතාම ඉදිරිපත් නොකරන බවට අනුමාන කළ හැකිය. ඒ අනුව දෙවන පක්ෂය තම ස්ථාවරය තහවුරු කිරීමට මුළුමනින්ම අපෝසත් වී ඇති බවට තීරණය කරමි.

හුදෙක් වාචික කරුණු දක්වන දෙවන පක්ෂය ඊට අදාළ කිසිදු ලේඛනයක් කිසිවිටෙක ඉදිරිපත් කර නැති බව සාක්ෂි විශ්ලේෂණයේ දී තහවුරු වේ. එසේම වරාය විනය නීති මාලාව එහි පරිපාලන අධිකාරිය විසින් සකස් කර ගන්නා නීති මාලාවකි. එහි සඳහන් තත්වයන් මගින් රටේ පවතින ප්‍රධාන නීති අභිබවා යාමේ හැකියාවක් නැත. ස්වාභාවික යුක්ති මූලධර්ම කඩකර අසාධාරණ ලෙස කටයුතු කිරීමේ හැකියාවක් ද තිබිය නොහැක.

350 වන පිටුව

ප්‍ර : ඒ සම්බන්ධයෙන් වරාය අධිකාරිය විසින් පවත්වනු ලබන විනය පරීක්ෂණයකදී වරදකරු කරනු ලැබූවෙක්ට වරාය අධිකාරිය විසින් කුමන දඬුවමක් ද ලබාදෙන්නේ?

පි : එහි සඳහන් වන ආකාරයට චෝදනාව සම්බන්ධයෙන් උසාවිය හෝ රේගු අධ්‍යක්ෂකවරයා විසින් නිකුත් කරන ලද නියෝගයක් වේ නම් ඒ ගැන නොතකා විනය පරීක්ෂණයේ තීන්දුව අවසන් තීරණය ලෙස දක්වා ඇත.

ඒ අනුව විනය පරීක්ෂණය කරන නිලධාරියාගේ තීරණය සෙසු නීති තත්ත්වයන් අභිබවා යාහැකි තත්වයක් පෙන්නුම් කර ඇත.

කෙසේ වෙතත් මෙම ප්‍රශ්නයට අදාළ වාහනය CFS 1 ගුදමෙන් පිටවී මීටර් 50 ක් පමණ දුරක් එනවිටම නවතා පරීක්ෂා කර ඇති අතර එතනට ඒකක ආරක්ෂක ප්‍රධානි කැප්ටන් වීරසූරිය මහතා ද පැමිණ ඇත. එහිදී සාගර යන අයගේ වාහනයේම පැමිණි ප්‍රධාන නියෝජ්‍ය කළමනාකාර ආරක්ෂක තැනගේ රියදුරු එම ස්ථානයේ දීම නිදහස් කර යැවීම පිළිබඳව සාක්ෂි අනුව පැහැදිළි වේ. වාහනයේ රියදුරු ආර්. පී. ආනන්ද සාගර මහතා (පළමු පක්ෂය) සහ ඔහු සමග පැමිණි ආරක්ෂක නියාමකයන් වන දිමුතු ප්‍රසන්න බඹරුද්ද මහතා සහ සම්පත් ප්‍රියංකර මහතා යන අය විත්තිකරුවන් කර මහේස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කර ඇති අතර ප්‍රධාන ආරක්ෂක කළමනාකරුගේ රියදුරු එහි දී කිසිදු වගවිභාගයකින් තොරව නිදහස් කර යවනු ලබන අතර ඔහු අවම වශයෙන් සාක්ෂිකරුවකු වශයෙන් හෝ නම්කර නැත. ඒ අනුව පෙනී යන්නේ ඔහු යම් සැලැස්මකට අනුව කටයුතු කර ඇති බවයි.
ඒ අනුව ඔත්තුව ලද පුද්ගලයා වන නියෝජ්‍ය ආරක්ෂක කළමනාකාර තැනගේ රියදුරු සඟවා තැබීමෙන් පෙනීයන්නේ ඔහු මෙම සිද්ධියට සෘජුව සම්බන්ධ බැවින් හරස් ප්‍රශ්නවලට භාජනය වීම වළක්වා ගැනීමේ අටියෙන් ඔහු නිදහස් කර හැරියාද යන සැකය සාධාරණ පුද්ගලයාගේ දෘෂ්ටිකෝණයෙන් බලන කල උද්ගතවන බවයි.

ස්වාධීන විධිමත් විනය පරීක්ෂණය කළ බව පුන පුනා ප්‍රකාශ කලත් කිසිම අවස්ථාවක එහි තීරණය හෝ අවම වශයෙන් සමස්ථ ගොනුව හෝ මෙම බේරුම්කරණ පරීක්ෂණයට ඉදිරිපත් කර නැත. දෙවන පක්ෂයේ සමස්ථ ක්‍රියාවලියම සාධාරණීකරණය කිරීමට ඔවුන් පුන පුනා ප්‍රකාශ කලේ ඒ පිළිබඳවයි. ඒ අනුව තීරණය කළ හැක්කේ විධිමත් විනය පරීක්ෂණයක් කර නැති බවයි.වරාය අධිකාරියේම ආරක්ෂක අධිකාරිවරයෙක් වන චන්ද්‍රපාල මහතා විසින් ස්වාධීන විනය පරීක්ෂණය කළ බව බද්දේගෙදර සමරරත්නගේ සාක්ෂිය අනුව තහවුරු වේ.
ඒ අනුව එකී පරීක්ෂණය ස්වාධීන පරීක්ෂණයක් නොවන බව ඔවුන්ගේම සාක්ෂි අනුව තහවුරු වී ඇත. මෙම ක්‍රියාවලිය මුළුමනින්ම මෙහෙයවා ඇත්තේ ආරක්ෂක අංශය විසිනි. ඒ අනුව තමාගේ නඩුව තමා විසින්ම විසඳා ඇති බව පෙනේ.

2022.04.27 දින සටහන් (198 පිටුව)

කේ. එම්. හර්ෂන මධුරංග යන අය සාක්ෂි දීමේදී.

ප්‍ර : පෙරදින හරස් ප්‍රශ්න ඇසීමේදී විනය ගොනුව නැතුව උත්තර දෙන්න බැහැ කියලා තමයි තමුන් ප්‍රකාශ කලේ ? අද දින සාක්ෂි දෙන්න අවශ්‍ය බව දූනගෙන හිටියා නේද? ඒ සම්බන්ධව පියවරක් ගත්තේ නැත්තේ ඇයි?
පි : විනය ගොනුව ස්ථිර වශයෙන් ම තියන තැන එල් ටී එකට ඉදිරිපත් කරලා තිබෙනවාද? කියන එක තමයි ප්‍රශ්නය. එය ආරක්ෂක කොට්ඨාසයේ නැහැ මේ වන කොට.

යන ප්‍රකාශය අනුව දූනට විනය ගොනුවක් වරාය අධිකාරිය සතුව නැතුව බව සනාථ වේ.

320 පිටුව

ප්‍ර : ඔය තුන්දෙනා විතරද ආවේ ?
පි : නැහැ තව කෙනෙක් ආවා.
ප්‍ර : ඒ ගැන කීවේ නැහැ නේද ?
පි : (පිළිතුරු නැත)

ඒ අනුව එම සිද්ධිය වසන් කිරීමට උත්සාහ කරන බවක් ද සනාථ වේ.
(නියෝජ්‍ය ආරක්ෂක කළමනාකරුගේ රියදුරු පැමිණි බව.)

ප්‍ර : එයා කව්ද ?
පි : රියදුරු
ප්‍ර : කවුද ඒ. උසස් නිලධාරියා?
පි : ආරක්ෂක අංශයේ උසස් නිලධාරියා.

322 පිටුව

ප්‍ර : මම තමුන්ට යෝජනා කරන්නේ තමුන්ට මෙම පිරිස තමයි නිර්නාමික දුරකථන ඇමතුම දුන්නේ කියලා ?
පි : පිළිතුරක් නැත (ප්‍රතික්ෂේප ද කර නැත) (ඒ අනුව මෙම සාක්ෂිකරු ඒ පිළිබඳව දූනුවත් බවට අනුමිතියකට පැමිණිය හැකිය)

පිටුව 323

ප්‍ර : ඇයි අනිත් පුද්ගලයා අත්අඩංගුවට ගත්තේ නැත්තේ ?
පි : මම මූලිකත්වය ගත්තේ නැහැ.ඒකක ප්‍රධානි එතන සිටියා ....... මම තීරණ ගන්නේ නැහැ.

එහි දී වාහනයේ 4ක් පැමිණ ඇති අතර නියෝජ්‍ය ප්‍රධාන ආරක්ෂක කළමනාකරුගේ රියදුරු එහිදීම නිදහස් කර ඇත. ඔහු අවම වශයෙන් මෙම නඩුවේ සාක්ෂිකරුවෙකු ලෙස හෝ යොදාගෙන නැත. ඒ අනුව යම්කිසි සැලැස්මකට අනුව කටයුතු කර ඇති බවට සැකයක් උද්ගත වේ.

327 පිටුව

ප්‍ර : .................... මෙතෙන නිලධාරීන් 4 ක් ගියා. 4න් එක්කෙනෙක් තමුන්ලා නිදහස් කළා?
පි : මම කළේ නැහැ උසස් නිලධාරීන් කළේ

ඒ අනුව තහවුරු වන්නේ උසස් නිලධාරීන් විසින් අයුතු සහගත ලෙස කටයුතු කර ඇති බවයි.

එසේම 327 පිටුවේ

ප්‍ර : විනය පරීක්ෂණය කලේ කවුද? මම තමුන්ට යෝජනා කලොත් ඒ හිටියේ චන්ද්‍රපාල මහත්මයා කියලා තමුන්ගේ ආරක්ෂක කොට්ඨාසයේ ?

පි : ඔව් එයා තමයි.

ඒ අනුව ආරක්ෂක අංශයේම ඉහළ නිලධාරියෙකු විනය පරීක්ෂණය කර ඇති බව ඔවුන්ගේම සාක්ෂි අනුව තහවුරු කර ඇත.

R 12 වශයෙන් ලේඛනයක් ලකුණු කර නැති අතර ඒ වෙනුවට පැ 11 ලේඛනයේම පිටපතක් ඉදිරිපත් කර ඇති බව ගොනුවේ ලේඛන පිරික්සීමේ දී නිරීක්ෂණය විය. එය ලකුණු කළ ලේඛනයක් නොවන බවද පෙනී යයි. එහෙයින් එය නොසලකා හැරීමට කටයුතු කිරීමට තීරණය කරමි. එසේම ප්‍රධාන ආරක්ෂක කළමනාකරුගේ රියදුරු තැන පිළිබඳව ප්‍රශ්න කරන අවස්ථාවේ වසන් කිරීමට උත්සාහ කරන බවක් ද තහවුරු වේ.

319 පිටුව.

ප්‍ර : ඔය තුන්දෙනා විතරයි නේද ආවේ?

පි : නැහැ. තව කෙනෙක් ආවා.

ප්‍ර : කවුද ඒ අනිත් එක්කෙනා ?

පි : ධර්මරත්න කියලා කෙනෙක්.

පිටුව 321.

ප්‍ර : එයා කවුද?

පි : එයා රියදුරෙක්

ප්‍ර : කවුද උසස් නිලධාරීන් ?

පි : ආරක්ෂක අංශයේ උසස් නිළධාරියෙක්.

යන කරුණු අනුව එය සනාථ වේ. කෙසේ වෙතත් මෙම පරීක්ෂනයට අදාල තොරතුරු ලබාගන්නා පුද්ගලයා වන්නේ කපිතාන් හර්ෂ වීරසූරිය යන අයයි. ඔහුගේ රියදුරු CFS1 ගුදම ආසන්නයේදීම පළමු පක්ෂයේ වාහනයට ගොඩවදින අතර භාණ්ඩ පරීක්ෂාව සඳහා වාහනය නතර කරනු ලබන ස්ථානයේ දීම කිසිදු වග විභාගයකින් තොරවම ඔහු පමණක් නිදහස් කර හැරීම කළ මෙම භාණ්ඩ අත්අඩංගුවට ගැනීම පිළිබඳව සාධාරණ සැකයක් සාධාරණ පුද්ගලයන් තුළ ඇති වන බව නොරහසකි.

විනය නීති මාලාව අනුව ස්වාධීන නිලධාරියෙකු විනය පරීක්ෂණය සඳහා පත්කල යුතු වුවද ආරක්ෂක අංශයේම අධිකාරීවරයෙක් වශයෙන් එවකට කටයුතු කළ චන්ද්‍රපාල මහතා ඒ සඳහා පත්කර ඇති බව පෙනේ. ඒ අනුව තමන්ගේ නඩුව තමා විසින්ම විසඳා ගැනීමට පියවර ගෙන ඇති බව තහවුරු වේ. ඒ අනුව ඔවුන් තමන්ගේම විනය නීති මාලාවද උල්ලංඝනය කර ඇති බව තහවුරුවී ඇත. සේවකයා චෝදනා වලට වැරදිකරු වේ නම් සේවයෙන් පහකල යුතුවේ. යනුවෙන් සඳහන්ව ඇතත් විධිමත් විනය පරීක්ෂණ වාර්තාවක් සලකුණු කර නැති අතර පරීක්ෂණය කර ඇත්තේ ආරක්ෂක අංශයේම ඉහළ නිලධාරියෙක් විසින් වන හෙයින් ස්වාධීනත්වයක් ද එහි නැති වග තහවුරු වී ඇත. කෙසේ වෙතත් දෙවන පක්ෂය කිසිදු විනය පරීක්ෂණ වාර්තාවක් මෙම පරීක්ෂණය සඳහා ඉදිරිපත් කර නැත. ඒ අනුව එළඹිය හැකි නිගමනය වන්නේ විධිමත් විනය පරීක්ෂණයක් කර නැති බවයි. නැතහොත් පරීක්ෂණයක් කර තිබුණ ද එය විධිමත් නැති හෙයින් ඉදිරිපත් නොකරන බවයි. ඒ අනුව සමස්ථ කරුණු සලකා බැලීමේ දී වගඋත්තරකාර අධිකාරිය තමන් ක්‍රියාකර ඇති ආකාරය සාධාරණීකරණය කිරීමට අසමත්වී ඇති බව තහවුරු වී ඇති බවට තීරණය කරමි. අදාළ විනය පරීක්ෂණය ස්වාධීන විනය පරීක්ෂණයක් නොවන අතර තමාගේ නඩුව තමා විසින්ම විසඳා ගැනීමක් වශයෙන් මෙම තත්වය පැහැදිළි කළ හැකිය. එය ස්වාභාව යුක්ති මූලධර්ම කඩ කළ අවස්ථාවකි.

337 පිටුවේ සටහන් අනුව

ප්‍ර : ........................................ මෙතන නිලධාරීන් හතරක් ගියා. හතරෙන් එක්කෙනෙක් තමුන්ලා නිදහස් කළා.

පි : මම කළේ නැහැ උසස් නිලධාරීන් කලේ. (323 පිටුව) මෙම තත්වය ''ඒකක ප්‍රධානී එතන හිටියා. මම තීරණ ගත්තේ නැහැ.''

ඒ අනුව ප්‍රධානීන් විසින් තීරණ ගෙන ඔවුන්ට හිතවත් අය නිදහස් කර ඇති බවත් තහවුරු වේ. එසේම මෙම සැලැස්මේ ඔහුද කොටස් කරුවෙක් ද යන සාධාරණ සැකය ද මෙහිදී උද්ගත වේ. (ඔහු පැමිණි ස්ථානය සහ වෙලාව අනුව)

පිටු අංක 321

ධර්මරත්න නැමැති රියදුරු තැන ආරක්ෂක අංශයේ උසස් නිලධාරියෙකුගේ රියදුරෙක් බවද පිළිගෙන ඇත. මෙම ක්‍රියාවලිය සඳහා ආරක්ෂක අංශයට සම්බන්ධ රියදුරන් සහ නියෝජ්‍ය ප්‍රධාන ආරක්ෂක කළමනාකරුගේ හිතවතුන් කීපදෙනෙකුගේ සහය ලැබී ඇති බව සාක්ෂි අනුව තහවුරු වේ. ඔහුගේ රියදුරුට CFS 1 ගුදමට ඇතුලු වීමට අවසර නැති බව සෙසු සාක්ෂි මගින් ප්‍රකාශ කර ඇතත් නියෝජ්‍ය ප්‍රධාන ආරක්ෂක කළමනාකරුගේ කටයුතු සඳහා ඔහුගේ අවසරය ඇති ව ඕනෑම තැනක යාහැකි තත්වයක් එවැනි අයෙකුට ඇති බවට උපකල්පනය කළ හැකිය. මෙම වැටලීමේ ක්‍රියාවලිය සැලසුම් සහගතව කර ඇති බව සමස්ථ චිත්‍රය විග්‍රහ කර බැලීමේදී තහවුරුවක් ලබාගත හැකි බව පෙනේ. මෙම සිද්ධිය වටා කටයුතු කරන සියලුම නිලධාරීන් ආරක්ෂක අංශයේම අයවීමක්, කපිතාන් හර්ෂ වීරසූරිය එහි මූලිකයා, වීමත්, ඔහුගේ රියදුරු ගුදම CFS 1 ගුදම ප්‍රාදේශයේ සැරිසැරීමත් යන කරුණු දාමයක් වශයෙන් සැලකීමේ දී පළමු පාර්ශ්වයේ නීතිඥ තැන යෝජනා කර ඇති ආකාරයට පළමු පක්ෂය කොටු කිරීම සඳහා මෙම වැටලීම සැලසුම් සහගතව ඔවුන් විසින්ම කළාද යන සැකය සාධාරණ පුද්ගලයාගේ සංකල්පයෙන් බලන විට ඇති වන බව පැහැදිළි වේ.

පැ 10. වශයෙන් ලකුණු කර ඇති විනය නීති මාලාවේ 46 වන පිටුවේ සඳහන් අපචාරයන් සම්බන්ධයෙන් කාර්ය පටිපාටිය දක්වා ඇත.

එහිම 3 වන වගන්තිය අනුව වරාය අධිකාරියේ විමර්ශණ යටතේ.

''මූලික පරීක්ෂණයෙන් අනාවරණය වේනම් විධිමත් පරීක්ෂණයේ ප්‍රතිඵල ලැබෙන තෙක් ඔහුගේ වැඩ තහනම් කළ යුතුවේ. වැඩතහනම් කිරීමේ කාලය පඩි රහිතව විය යුතුවේ. එම චෝදනාව සම්බන්ධයෙන් රේගු අධ්‍යක්ෂක ජනරාල් විසින් හෝ උසාවිය විසින් නිකුත් කරන ලද නියෝගයක් වේ නම් ඒ ගැන නොතකා විධිමත් විනය පරීක්ෂණයේ තීරණය අවසන් තීරණය වනු ඇත''.

''චෝදනා කිසිවක් විධිමත් විනය පරීක්ෂණයේ දී ඔප්පු වුවහොත් සේවකයා සේවයෙන් පහ කළ යුතුවේ.'' යනුවෙන් සඳහන් ව ඇති බව පෙනේ.

මෙහිදී මතුවන මූලිකම ගැටලුව වන්නේ විධිමත් පරීක්ෂණයක් ගැන පුන පුනා ප්‍රකාශ කළ දෙවන පක්ෂය කිසිම අවස්ථාවක එය තහවුරු කිරීම සඳහා ඊට අදාළ ගොනුව හෝ නියෝගය මෙම පරීක්ෂණයට ඉදිරිපත් කර නැතිවීමයි. ඒ අනුව එළඹිය හැකි නිගමනය වන්නේ එබඳු පරීක්ෂණයක් කර නැති බවයි. නැතහොත් ඉදිරිපත් කළ හැකි තත්වයක නැති බවයි.

පැ (5) වශයෙන් ලකුණු කර ඇති විනය නීති මාලාවේ 46 වන පිටුවේ සිට 47 අවසානය දක්වා අපචාර සම්බන්ධව අනුගමනය කරන කාර්ය පටිපාටිය දක්වා ඇත. දෙවන පක්ෂය නීතිමය තත්වය ගෙනහැර පානවා විනා තමාගේ එම ක්‍රියාවලිය සාධාරණව කළ බවට තහවුරුවක් නොකරන බව පෙනේ.

එහි විධිමත් පරීක්ෂණයේ තීරණ අවසාන තීරණය වනු ඇත. ''සඳහන් කරන ලද අපචාරවලට සම්බන්ධිත චෝදනා කිසිවක් විධිමත් පරීක්ෂණයේ දී ඔප්පු වුවහොත් සේවකයා සේවයෙන් පහ කළ යුතුවේ.'' යනුවෙන් සඳහන් කර ඇත.

දෙවන පක්ෂය විධිමත් විනය පරීක්ෂණයක් ගැන දිගින් දිගටම සඳහන් කරන නමුත් විධිමත් පරීක්ෂණයක් කළ බවට කිසිදු ලේඛනයක් ඉදිරිපත් කර නැති අතර අවම වශයෙන් එබඳු ගොනුවක් හෝ ඉදිරිපත් කර නැත. ඊට අදාළ නීතිමය තත්වය පමණක් දක්වා ඇති බවත් ඒ අනුව දෙවන පක්ෂය විධිමත් පරීක්ෂණයක් කළ බවට වාචික සාක්ෂි ඉදිරිපත් කලත් ලේඛන අනුව තහවුරු කර නැති බවක් පළමු පක්ෂය ද තමන්ගේ නිර්දෝෂි භාවය තහවුරු කිරීමට දැනුමක් සහිත, බුද්ධිමත් අයෙක් නොවන බවද සමස්ථ සාක්ෂි විශ්ලේෂණයේදී තහවුරු වේ.

75 පිටුව

ප්‍ර : විනය පරීක්ෂණයේ තීන්දුවක් ඔබට ලැබුණා ද?

පි : නැහැ ස්වාමිණී.

ඒ අනුව ඔහුට විනය පරීක්ෂණ තීන්දුව ලබා දී නැති අතර වැඩ තහනම පමණක් ලබා දී ඇති බව සනාථ වේ. ඒ අනුව එළඹිය හැකි පූර්වානුමිතිය වන්නේ එවැනි විනය පරීක්ෂණයක් කර නැති බවයි. විනය පරීක්ෂණයක් කර තිබුණේ වුවද එය ස්වාධීන විධිමත් එකක් නොවන හෙයින් ඉදිරිපත් කිරීමේ හැකියාවක් නැති බවට නිගමනය කළ හැකිය. වරාය වැනි දැඩි ආරක්ෂා සහිත සුවිසල් ආයතනයක එබඳු ගොනුවක් අස්ථාන ගතවීම කෙසේවත් අපේක්ෂා කළ නොහැකි තත්වයකි.

184 පිටුව

ප්‍ර : මෙම විනය පරීක්ෂණය පැවැත්වූයේ කා විසින් ද?

පි : ආරක්ෂක කොට්ඨාසයේ චන්ද්‍රපාල කියලා ආරක්ෂක අධිකාරිවරයෙක්.

විනය පරීක්ෂණය පැවැත්වීමට අදාළ උපදෙස් පැ 11 ලෙස ලකුණු කර ඇත.

පැ 11 අනුව විනය නීති මාලාවේ පරීක්ෂණ පැවැත්වීමට අදාළ කොටස දැක්වේ. ඒ අනුව ''අ'' සිට ''ද'' දක්වා වගන්ති ඊට අදාළව දක්වා ඇත. එහි අ (I) යටතේ සඳහන් වන්නේ,

''මෙම අධිකාරියේ සේවකයෙකු සේවයෙන් පහ කිරීමට තරම් බරපතල විෂමාචාර ක්‍රියාවලට භාජනය වූ අවස්ථාවලදී පමණක් ඒ සම්බන්ධයෙන් පවත්වනු ලබන විධිමත් විනය පරීක්ෂණයේ දී පැමිණිල්ල මෙහෙය වීම සඳහා ස්වාධීන නිලධාරියෙකු පත් කිරීමට ක්‍රියා කළ යුතුවේ. එවැනි පැමිණිලි මෙහෙයවන නිලධාරීන් පිළිපැදිය යුතු උපදෙස් මාලාව ''ඔ'' උපලේඛනයේ දැක්වේ.''

යනුවෙනි.

මෙම විනය පරීක්ෂණය කර ඇත්තේ ආරක්ෂක අධිකාරි චන්ද්‍රපාල මහතා විසිනුයි. ඒ අනුව පැහැදිළි ලෙසම විනය නීතිමාලාව උල්ලංඝනය කර ඇති බව තහවුරුවේ. තම අංශයේම ප්‍රධානියෙකු විසින් එය මෙහෙයවා තීන්දු ලබාදී තිබීම විනය නීති මාලාවට පටහැනිව කටයුතු කිරීමකි. විනය නීති මාලාවේ 46 පිටුවේ සඳහන් සොර බඩු ගෙනයාමට අදාළ කාර්ය පටිපාටිය අනුව සොරකම සහ නීති විරෝධී ලෙස භාණ්ඩ ගෙන යාමට අදාළ නීති දක්වා ඇති අතර එහි (2) අ) සහ (ආ), (ඇ), (ඈ), (ඉ) යටතේ අදාළ නීති තත්වය පැහැදිළි කර ඇතත් දෙවන පක්ෂය ඒ අනුව කටයුතු කර නැත. 03 වන වගන්තිය යටතේ විධිමත් විනය පරීක්ෂණයක් පවත්වා එහිදී චෝදනා සනාථ වේ නම් පමණක් සේවකයා සේවයෙන් පහ කළ හැකි බව දක්වා ඇත. ඒ අනුව කටයුතු කර නැති බව සමස්ථ සාක්ෂි අනුව තහවුරු වී ඇත.

මෙහිදී ගැටලුව වන්නේ වරාය අධිකාරිය පුනපුනා සඳහන් කරන විධිමත් විනය පරීක්ෂණය කළ බවට කිසිදු පිළිගත හැකි ලේඛනයක් ඉදිරිපත් කර නැති හෙයින් ඔවුන්ගේ ක්‍රියා කලාපය සාධාරණීකරණය කර නැති වීමයි. වරාය අධිකාරිය දිගින් දිගටම විධිමත් විනය පරීක්ෂණයක් කළ බවට කරුණු ඉදිරිපත් කර ඇතත් විධිමත්ව පරීක්ෂණය කළානම් ඊට අදාළව විධිමත් නියෝගයක් හෝ තීන්දුවක් තිබිය යුතුය. එවැනි තත්වයක් සනාථ කර නැති බැවින් ඔවුන් ඒ මත ගොඩනගන හුදු වාචික සාක්ෂි පිළිගත නොහැකි සාක්ෂි වශයෙන් ප්‍රතික්ෂේප කර පළමු පක්ෂයට අසාධාරණයක් කර ඇති බවට ද තීන්දු කරමි.

කෙසේ වෙතත් පළමු පක්ෂයේ ක්‍රියා කලාපය පිළිබඳව ද මෙහිදි සලකා බැලිය යුතුය. සාවද්‍ය ලෙස ලකුණු කර ඇති පැ 11 අනුව (පැ 5 හි පිටුවක්) පැ 11 ලෙස ලකුණු කර ඇත. ඒ අනුව පරීක්ෂණය පැවැත්වීම යටතේ,

1. ''මෙම අධිකාරියේ සේවකයෙකු සේවයෙන් පහ කිරීමට තරම් බරපතල විෂමාචාර ක්‍රියාවලට භාජනය වූ අවස්ථා වලදී පමණක් ඒ සම්බන්ධයෙන් පවත්වනු ලබන විධිමත් විනය පරීක්ෂණයේ පැමිණිල්ල මෙහෙයවීම සඳහා ස්වාධීන නිලධාරියෙකු පත් කිරීමට ක්‍රියා කළ යුතුවේ. එවැනි පැමිණිල්ල මෙහෙය වන නිලධාරීන් විසින් පිළිපැදිය යුතු උපදෙස් මාලාව ''ඔ'' උපලේඛනයේ දැක්වේ. යනුවෙන් සඳහන් වේ.

   දෙවන පක්ෂයේ ලිඛිත දේශනයේ සමාප්තිය දක්වන ස්ථානයේ පළමු පක්ෂයේ විෂමාචාරයට අදාළව දෙවන පක්ෂය විසින් විධිමත් විනය පරීක්ෂණයක් පවත්වා ඇති අතර එය සියලු ස්වභාවික යුක්ති මූලධර්මයන්ට අනුකූලව සිදු කොට ඇති බවට කරුණු සනාථ වී ඇති බැවින් එම පරීක්ෂණ මඟින් එළඹුණු තීරණයන් බලහීන කිරීමට කිසිදු අවශ්‍යතාවයක් පැන නොනගින බවත්'' යනුවෙන් දක්වා ඇත.

විධිමත් විනය පරීක්ෂණයක් කළානම් එහි නිරීක්ෂණ සහ නිගමන තිබිය යුතුය. ඒ සම්බන්ධව හුදු වාචික ප්‍රකාශයක් හැරුණු විට කිසිඳු පිළිගත හැකි ලේඛනයක් මෙම පරීක්ෂණයට ඉදිරිපත් කර නැත. පළමු පක්ෂයද පිළිගෙන ඇත්තේ පරීක්ෂණයක් තිබුණ බව පමණි. විධිමත් බව පිළිගෙන නැත. එබඳු තීරණයක් හෝ දෙවන පක්ෂය විසින් බේරුම්කරණයට ඉදිරිපත් කර නැත්තෙත් එවැන්නක් කළ බවට සනාථ කර නොමැති බැවින් එම කරුණු ප්‍රතික්ෂේප කරමි.

2. කම්කරු විනිශ්චය සභා නඩුව ඉල්ලා අස්කරගෙන තිබීම මත නිෂ්ප්‍රභා කර ඇත. ඒ පිළිබඳව විවාදයක් නැත.

3. කම්කරු විනිශ්චය සභාවකින් ඉල්ලන සහන සහ බේරුම්කරණයෙන් ලබාදෙන සහන අතර පැහැදිළි වෙනසක් ඇති බව දෙවන පක්ෂය නොදන්නවා විය හැකිය. පළමු පක්ෂය නැවත රැකියාව ඉල්ලා ඇතද ඒ පිළිබඳව කිසිදු සලකා බැලීමක් මෙහිදී සිදුකරනු නොලබන අතර අසාධාරණයක් වී තිබේ ද යන්න පමණක් සළකා බලන හෙයින් එම විරෝධතාවයද ප්‍රතික්ෂේප කරමි.

4. පළවන කරුණ ඉටු කර නැති බැවින් මෙම කරුණුද ප්‍රතික්ෂේප කරමි. කිසිදු වග විභාගයකට අදාළව ලේඛනයක් ඉදිරිපත් කිරීමට දෙවන පක්ෂය කටයුතු කර නැත. මහේස්ත්‍රාත් අධිකරණයෙන් නිදොස් කොට නිදහස් කර තිබියදී විනය පරීක්ෂණ හෝ තීන්දුව ඉදිරිපත් කර නැත. ඒ අනුව සියලු විරෝධතා ප්‍රතික්ෂේප කර මෙම නඩුව විභාගයට ගෙන ඇති බවද ප්‍රකාශ කර සිටිමි.

ඒ 9 ලේඛනය අනුව බේරුම්කරණය කැඳවීම් කර ඇත.

75 පිටුව

ප්‍ර : විනය පරීක්ෂණයේ තීන්දුවක් ඔබට ලැබුණා ද?

පි : නැහැ ස්වාමිණි.

සාක්ෂි සටහන් අනුව ඔහුට විනය පරීක්ෂණ තීන්දුව දන්වා නැති අතර වැඩ තහනම පමණක් ලබාදී ඇත. ඒ අනුව ද පෙනී යන්නේ විධිමත් විනය පරීක්ෂණයක් කර නැති බවයි.

327 පිටුව

ප්‍ර : ........... මෙතන නිලධාරීන් හතර දෙනෙක් ගියා හතර දෙනාගෙන් එක් කෙනෙක් තමන්ලා නිදහස් කළා.

පි : මම කළේ නැහැ. උසස් නිලධාරීන් කළේ. විනය පරීක්ෂණය සම්බන්ධයෙන් ප්‍රශ්න කිරීමේ දි.

337 පිටුව

ප්‍ර : චන්ද්‍රපාල මහත්මයා නේද තමන්ගෙන් ප්‍රශ්න ඇහුවේ?

පි : නෑ නෑ මගෙන් තව හරස් ප්‍රශ්න ඇහුව්වා තව කෙනෙක් යනුවෙන් ප්‍රකාශ කරන අතර චන්ද්‍රපාල මහතා ආරක්ෂක අංශයේ නිලධාරියෙක් අධිකාරිවරයෙක් බව හෙළිකිරීමට අකමැත්ත දක්වා ඇත.

නියෝජ්‍ය ප්‍රධාන ආරක්ෂක කළමනාකරුගේ රියදුරුගේ රාජකාරිය ඔහුගේ වාහනය පැදවීමයි. එහෙත් නියෝජ්‍ය ප්‍රධාන කළමනාකරු වාහනයෙන් අදාළ ස්ථානයට පැමිණ සිටියදී ඔහුගේ රියදුරු අදාළ ගුදම අභියස සිට හොර භාණ්ඩ ගෙන ආ වාහනයේම පැමිණ තිබීමෙන් පෙනී යන්නේ මෙම වැටලීමට අදළ භාණ්ඩ එම වාහනයට පටවා ගන්නා අවස්ථාව පිළිබඳව ඔහු සොයා බැලීමක් කළා ද යන සැකය ඇති වන බවයි. ආනන්ද සාගර ගේ 2008.05.05 දින සහකාර ආරක්ෂක නිලධාරී ගුණදාස විසින් ලියා සටහන් යොදා ඇති සාගරගේ ප්‍රකාශය R 9 A ලෙස සලකුණු කර ඇති අතර එහි සඳහන් පරිදි මෙම භාණ්ඩ ගුදමේ වාප්පු ලිපිකරුවන්ගෙන් ලබාගත් භාණ්ඩ බවට ප්‍රකාශයක් සිදුකර ඇත. එහෙත් වාප්පු ලිපිකරුවන්ට එරෙහිව කිසිදු ක්‍රියාමාර්ගයක් ගත් බව දක්වා නැත. සාක්ෂි කැඳවීමක් ද කර නැත. ඒ අනුව එය සැලැස්මක්ද යන සැකය උද්ගත වේ.

එහි දී පළමු පක්ෂය ප්‍රකාශ කර ඇති පරිදි

එම භාණ්ඩ එකවර ලබාගත් ඒවා නොවන බවත්, වරින් වර ලබාගත් භාණ්ඩ වන බවත්, වලංගු ලිපි ලේඛන නොමැති බවත්, පිළිගෙන ඇත. ඒ අනුව වරාය ආරක්ෂක අංශය විසින්ම සංවිධානාත්මකව ඔහු මෙම වංචනික ක්‍රියාවට කොටු කළාද යන සැකයද නොසලකා

හැරිය හැකි කරුණක් නොවේ. මන්ද? මෙම පරීක්ෂණයෙන් පසුව හෝ මෙම වාප්පු ලිපිකරුවන් සම්බන්ධව සොයා බැලීමක් කළ බව හෝ ඔවුන්ට එරෙහිව ගත් ක්‍රියා මාර්ගයක් හෝ කිසිම අවස්ථාවක තහවුරු කර නැති බැවිනි, ඒ අනුව ඔහුගේ නොදනුවත් කම උපයෝගී කරගෙන ඉහළ නිලධාරීන්ගේ පැවැති ද්වේශය ඉටු කරගත්තාද යන සැකයද සාධාරණ පුද්ගලයාගේ දෘෂ්ඨි කෝණයෙන් බලන කළ සනාථ වන බව පැහැදිලි වේ.

දෙවන පක්ෂය R 1 සිට R 13 දක්වා ලේඛන සමග ලිඛිත දේශන ගොනු කර ඇත. එහිදී R 11 වශයෙන් ලේඛනයක් ලකුණු කර නැති අතර R 11 හිස්තැනට පැ 11 ගොනු කර ඇති බවද නිරීක්ෂණය කරමි. ඉන් අනතුරුව R 13 A, R 13 B, R 13 C, R 13 D 1 ලකුණු කර R 14 ගොනු කර ඇති බවද නිරීක්ෂණය වේ. එය ලේඛන ගොනු කිරීමේ දී සිදුවූ කාර්යාලීය දෝෂයක් සේ සලකා කටයුතු කරන ලද බව ප්‍රකාශ කර සිටිමි.

වගඋත්තරකරුවන්ගේ ලිඛිත දේශනයේ 2022.07.07 දිනැති කාර්ය සටහන සමග කේ. එම්. හර්ෂණ මධුරංගගේ සාක්ෂියේදී

ප්‍ර : පුද්ගලික ලිපි ගොනුව අනුව විනය පරීක්ෂණයක් පැවැත්වූවාද නැද්ද කියලා තමන්ට කියන්න පුළුවන් ද

පි ඔව්. මූලික පරීක්ෂණයක් හා විධිමත් විනය පරීක්ෂණයකුත් පවත්වලා තියෙනවා.

යනුවෙන් සඳහන් කර ඇතත් ඒ බවට කිසිදු ලේඛනයක් කිසිදු අවස්ථාවක ලකුණු කර නැත. සමස්ථයක් වශයෙන් ගත් කළ තහවුරු වන්නේ දෙවන පක්ෂය විනය පරීක්ෂණයක් කළ බවට ඉදිරිපත් කර ඇති වාචික සාක්ෂි හැරුණු කොට විධිමත් ලේඛනයක් අනුව එම කරුණ තහවුරු කර නැති බවයි. එය විධිමත් නම් විධිමත් වාර්තාවක් තිබිය යුතුමය. නමුත් එවැන්නක් කිසිදු අවස්ථාවක ලකුණු කර නැත.

ඔවුන්ගේ ලිඛිත දේශනය පුරාවට කරුණු දක්වා ඇත්තේ සානුකම්පිතව පළමු පක්ෂයේ කරුණු පමණක් සලකා බලා තීරණය නොකල යුතු බවට බේරුම්කරණයට උපදෙස් දීමයි. ඊට අදාළව නඩු තීන්දු ඉදිරිපත් කළාවිනා තමන් කළ විධිමත් විනය පරීක්ෂණය තහවුරු කිරීමට කිසිදු ලේඛනයක් ඉදිරිපත් කර නැත.

බේරුම්කරණය මගින් සිදුකරනු ලබන්නේ නැවත රැකියාව හෝ ඊට අදාළව වන්දි ලබාදීම නොව සමස්ථ ක්‍රියාවලිය හරහා පළමු පක්ෂයට යම් අසාධාරණයක් සිදුවී තිබේද? එසේ නම් ඔහුට ලැබිය යුතු සහන කවරේද යන්න පිළිබඳව සලකා බැලීම පමණක් බව දෙවන පක්ෂය නොදන්නා බව පෙනී යයි. නැවත සේවයේ ස්ථාපිත කිරීම බේරුම්කරණයෙන් කිසිවිටෙක කරනු නොලැබේ. එවැනි බලයක් ද බේරුම්කරු සතු නොවේ.

සමස්ථයක් වශයෙන් ගත් කළ පළමු පක්ෂය වරදට අල්ලා ගන්නා අවස්ථාවේ සිට දෙවන පක්ෂයේ ක්‍රියා කලාපය යම් කිසි පක්ෂග්‍රාහි පදනමක් මත සහ සැලසුම් සහගත තත්වයක් යටතේ සිදු කර ඇති බවට පහත සඳහන් කරුණු මත සාධාරණ සැකයක් ගොඩනැගෙන බව පෙනී යයි.

1. ඔත්තුව ලබන පුද්ගලයා නියෝජ්‍ය ප්‍රධාන ආරක්ෂක කළමනාකරු වීම.
2. ඔහුගේ රියදුරු අදාළ ගුදම ආසන්න ප්‍රදේශයේම සිට භාණ්ඩ ගෙන ආ වාහනයටම ගොඩ වැදීම.
3. වාහනය පරීක්ෂා කිරීම සඳහා වාහනය නතර කළ සැනින් එහි සිටි නියෝජ්‍ය ප්‍රධාන ආරක්ෂක කළමනාකරුගේ රියදුරු වග විභාගයකින් තොරවම නිදහස් කර හැරීම සහ සෙසු සියල්ලන් විත්තිකරුවන් කිරීම.
4. ඔහු මෙම නඩුවේ සාක්ෂිකරුවකුලෙස හෝ යොදා නොගැනීම සහ සඟවා තබා ගැනීම.
5. වාප්පු ලිපිකරුවන් සම්බන්ධයෙන් කිසිදු පියවරක් ගෙන නොතිබීම සහ සාක්ෂි වශයෙන් හෝ කැඳවා නොතිබීම.
6. පළමු පක්ෂයේ ප්‍රකාශය අනුව දින ගණනාවක් භාරයේ තිබුණු එම භාණ්ඩ අල්ලා නොගෙන වාහනයෙන් ගෙන යන අවස්ථාවේ මගරැක සිට වැටලීම යන කරුණු අනුව යම් කිසි සැලසුමකට අනුව මේවා සිදුවී ඇති බවට අනුමිතියකට එළඹිය හැකි වීම යන කරුණු කෙරෙහිද අවධානය යොමු කළ යුතුව ඇති බව පෙනේ.

   පළමු පක්ෂය කපටි බුද්ධියක් ඇති පුද්ගලයෙකු නොවන බව පරීක්ෂණයේ දී ඔහුගේ ක්‍රියාකලාපය අනුව තහවුරු වේ. එසේම ඔහුගේ නීතිඥ තැන විසින් මෙම සිද්ධියට අදාළව ස්ථාවර දෙකක් ගෙන ඇති බවද සනාථ වී ඇත.

   01. ඉල්ලුම්කරු විසින් ආරක්ෂක අංශවලට මුල් ප්‍රකාශ ලබාදීමේදී වාප්පු ලිපිකරුවන්ගෙන් ඉල්ලා ගත් භාණ්ඩ වශයෙන් සඳහන් කර ඇත.

   02. පළමු පක්ෂය සතුව භාණ්ඩ වලට අදාළ ලේඛනයක් තිබුණ බවත්, එය ලබාදුන්නත් අල්ලා ගන්නා අවස්ථාවේ එය භාරනොගත් බවටත් යෝජනා කර ඇත. (පිටුව 327/3 වන ප්‍රශ්නය) එහෙත් එම දෙවන තත්වය පිළිගත නොහැක්කේ එය මෙම පරීක්ෂණයට හෝ ඉදිරිපත් කර නොතිබීම හේතුවෙනි.

   එසේම දෙවන පක්ෂය තම තීන්දු තීරණ සාධාරණීකරණය කිරීමට මූලිකවම බරතබන ස්වාධීන විනය පරීක්ෂණය හෝ එහි තීන්දුව හෝ කිසිම අවස්ථාවක මෙම පරීක්ෂණයට ඉදිරිපත් කර නැත. අවම වශයෙන් එබඳු ගොනුවක් හෝ ඉදිරිපත් කිරීමට

සමත් වී නැති බව නිරීක්ෂණය වේ. වරාය වැනි වගකීම් සහිත ආයතනයක මෙවැනි වගකීම් විරහිත තත්වයන් කෙසේවත් ඇති විය නොහැකිය. වෙනම නීති අංශයක් ද පවතින හෙයින් එම ලේඛන විධිමත්ව පවත්වාගෙන යාම සහ සුරක්ෂිත කර තැබීම අනිවාර්ය විය යුතු කරුණකි. කණගාටුවට කරුණ වන්නේ එම තත්වය වරායේ නීති අංශය තුලින්ද ඉටුවී නැති වීමයි. එයට හේතුව මූලික නෛතික සිද්ධාන්ත පිළිපැදීමකින් තොරව වරාය අධිකාරියේ ආරක්ෂක නිලධාරියෙකු හරහා පක්ෂග්‍රාහි විනය පරීක්ෂණයක් කර තිබීම මත එම ගොනු අතුරුදහන් වී ඇතුවාට සැක නැත.

ඒ අනුව එළඹිය හැකි නිගමනය වන්නේ දෙවන පක්ෂය නීතිමය කටයුතු කිරීමේ දී සාධාරණව කටයුතු කර නැති බැවින් එම ලේඛන ඉදිරිපත් කිරීම තමන්ට අවාසි දායක වන හෙයින් ඒවා ඉදිරිපත් නොකර කටයුතු කරන බවයි.

එසේම ඔවුන්ගේ ලිඛිත සැළකිරීම් ද සාක්ෂි සටහන් නැවත ඉදිරිපත් කිරීමක් බව පෙනී යයි. කිසිදු අදාළ ලේඛනයක් නොදක්වයි. මා විසින් ලබාදිය යුතු නියෝගය කෙබඳු එකක් විය යුතුද යන්නට අදාළව නඩුතීන්දු ගණනාවක් ඉදිරිපත් කර ඇතත් එම නියෝගවලට පදනම් කරගත යුතු කරුණු තර්කානුකූලව දැක්වීමක් කර නැත.

එහි සමාප්තියේ සඳහන්,

01. විධිමත් පරීක්ෂණයේ තීරණය බෙලහීන කිරීමක් අවශ්‍ය නොවන බව දක්වා ඇත. එබඳු තීරණයක් හෝ අවම වශයෙන් ගොනුවක පිටපතක් හෝ මෙම පරීක්ෂණයට ඉදිරිපත් කර නැත. ඒ අනුව ඒ පිළිබඳව කිසිදු සලකා බැලීමක් මෙම බේරුම්කරණයට කළ නොහැකි බව පැහැදිළිව පෙනේ. බෙලහීන කිරීමට හෝ බල ගැන්වීමට හෝ එවන් ලේඛනයක් ලකුණු කර නැත.

02. කම්කරු විනිශ්චය අධිකරණය විසින් ඉල්ලුම්පත්‍රය නිශ්ප්‍රභා කර ඇත්තේ නියමිත කාලය ඉකුත් වී එම නඩුව ගොනු කර තිබීම හේතුවෙනි. එම තත්වය බේරුම්කරණයට අදාළ නොවන තත්වයකි. කම්කරු ඇමතිගේ නියෝගය මත මෙම පරීක්ෂණ කර ඇත. සළකා බලනු ලබන්නේද නැවත රැකියාව නොව අසාධාරණයක් වී ඇත්නම් ලැබිය යුතු සහන කවරේද යන්න වේ.

03. කම්කරු අධිකරණයේ ඉල්ලූ ඉල්ලීම් වලට සමාන ඉල්ලීම් කර ඇතත් කම්කරු අමාත්‍යවරයාගේ බලතල අනුව එය යොමු කර ඇත්තේ 4 (1) වගන්තිය යටතේ වන අතර ඔහුට අසාධාරණයක් සිදුවී තිබේ ද යන්න සහ එසේ තිබේ නම් ලැබිය යුතු සහන කවරේද යන්න පමණක් මෙහි දී සලකා බලනු ලබන බව ඔහුහට නොවැටහීම අභාග්‍යයකි.

සාක්ෂි සමස්ථයක් වශයෙන් ගත් කල දෙවන පක්ෂය මූලිකවම ඔවුන්ගේ ක්‍රියාකලාපය සාධාරණී කරණය කිරීමට යොදා ගන්නා එකම පදනම විධිමත් විනය පරීක්ෂණයක් පවත්වා ඒ අනුව කටයුතු කළ බවයි. හුදෙක් එකී වාචික ප්‍රකාශය හැර කිසිදු අවස්ථාවක විධිමත් විනය පරීක්ෂණ වාර්තාවක් හෝ ගොනුවක් මෙම පරීක්ෂණයට ඉදිරිපත් කර නැත. ඒ අනුව දෙවන පක්ෂය තම ස්ථාවරය සනාථ කිරීමට අපොහොසත් වී ඇති බවට තීරණය කරමි.

එමතුද නොවේ. ආරම්භයේ සිටම ඔවුන් කටයුතු කර ඇත්තේද ඉතාමත් අසාධාරණ අයුරින් බව සනාථ වේ. අත්අඩංගුවට ගන්නා අවස්ථාවේදීම එක් අයෙකු නිදහස් කර යවනු ලබන අතර ඔහු විත්තිකරුවෙක් හෝ සාක්ෂි කරුවෙක් හෝ වශයෙන් යොදාගෙන නැත. ඔහු නියෝජ්‍ය ආරක්ෂක කළමනාකරුගේ රියදුරු වන අතර සිද්ධියට අදාළ ගුදම ආසන්නයේම තැනකින් විත්තිකරුවන්ගේ වාහනයට නැගීම සහ අත්අඩංගුවට ගන්නා අවස්ථාවේම නිදහස් කිරීමද නියෝජ්‍ය ආරක්ෂක කළමනාකරු විසින්ම එය කර තිබීමද අනුව යම්කිසි රහසිගත සැලැස්මක් ක්‍රියාත්මක කළ බවට අනුමිතියකට එළඹීම නිවැරදි බව පෙනේ.

ඉන්පසුව ඉතිරි තිදෙනාටම පොදුවේ සොරකම සහ සොරබඩු වරායෙන් ගෙනයාම යන චෝදනා ගොනුකර ඇති අතර මහේස්ත්‍රාත් අධිකරණයේ දී සාධාරණ සැකයෙන් තොරව චෝදනා ඔප්පු නොකිරීම මත තිදෙනාම නිදොස් කොට නිදහස් කර ඇත. එහෙත් වරාය අධිකරිය විසින් පවත්වන ලද විධිමත් විනය පරීක්ෂණයේ දී වාහනයේ හිමිකාරීත්වය මත සියලුම චෝදනා වලට ආනන්ද සාගර යන අය පමණක් වරදකරු කර සේවයෙන් පහකර ඇත. වාහනය අයිතිකරු වීම මත සමස්ත වගකීම ඔහුවෙත පවරා තිබීම අනුව එම තීරණය ගෙන ඇත.

ආනන්ද සාගර වරාය අධිකාරියට ලබාදුන් කටඋත්තරය අනුව එම භාණ්ඩ ඔහු විසින් වාප්පු ලිපිකරුගෙන් ලබාගත් බව ප්‍රකාශ කර ඇත. එහෙත් ආරක්ෂක නිලධාරියෙක් වශයෙන් වරායෙන් පිටතට භාණ්ඩ ගෙන යාම සඳහා වලංගු ලිපි ලේඛන අවශ්‍ය බව ඔහු හොඳින්ම දත යුතුය.

එසේම ඔහුද ද්විත්ව ස්ථාවරයක් ඒ සම්බන්ධව ගෙන ඇති අතර i. තමා නොදැනුවත්ව එම භාණ්ඩ වාහනයේ තිබූ බව සහ ii. වාප්පු ලිපිකරුවන්ගෙන් ඉල්ලා ගත් භාණ්ඩ තමා විසින් වාහනයේ පටවාගෙන පැමිණි බව යන අවස්ථා දෙකයි.

කෙසේ වෙතත් දෙවන පක්ෂය මෙම පරීක්ෂණයේ දී කටයුතු කර ඇති ආකාරය අනුව සාධාරණ සැකයක් උද්ගත වන අතර පළමු පක්ෂයේ වාහනය භාවිතය වලක්වාලීම සඳහා ඔහු අපහසුතාවයට පත් කිරීමට කටයුතු කලාද යන සැකයද ඉවත ලිය නොහැකි බව පෙනේ.

කෙසේ වෙතත් පළමු පක්ෂය වසර 20 කට අධික කාලයක් හොඳින් සේවය කළ අයෙකි. බරපතල ගණයේ පෙර වැරදි පිළිබඳව කිසිදු හෙළිදරව්වක් ද කිසිම අවස්ථාවක කර නැත. එසේම මෙම වැටලීම කළ ආකාරය පිළිබඳව සැක දනවන අවස්ථා ගණනාවක්ම තිබෙන

බව ඉහත විස්තර අනුව තහවුරු වී තිබේ. එසේම මෙම පරීක්ෂණයේදී දෙපක්ෂයේම දුර්වලකම් අඩුපාඩුකම් අතපසුවීම් රැසක්ම හෙළිදරව් වී තිබීමද විශේෂත්වයකි. දෙවන පක්ෂයේ ක්‍රියාවලිය අසාධාරණ සහ අයුක්ති සහගත වනවා මෙන්ම පළමු පක්ෂයද නොසැලකිල්ල සහ නොදැනුවත් කම මත මෙම තත්වයට කොටුවූවාද යන්නද ඉවත ලිය හැකි තත්වයක් නොවේ. ඒ අනුව මෙහිදී දෙපක්ෂයටම වගකීම් ගෙන මෙම ප්‍රශ්නය විසඳා ගැනීමට වගකීම් පැවරීම සාධාරණ සහ යුක්ති සහගත බව නිරීක්ෂණය වේ.

එසේම මෙම සේවකයා වසර විසිහතකට අධික කාලයක් අඛණ්ඩව සේවය කර ඇති සේවකයෙක් බවද පෙනේ. එසේම විධිමත් විනය පරීක්ෂණය කළ බවටද කිසිදු තහවුරුවක් ලිඛිත සාක්ෂි අනුව ඉදිරිපත් කිරීමට දෙවන පාර්ශ්වයට හැකිවී නැති බවද මෙහිදී විශේෂත්වයකි. ඒ අනුව දෙවන පක්ෂය සාධාරණව කටයුතු කර තිබෙන බවට කරන තර්කය කිසිසේත්ම පිළිගත හැකි පරිදි සනාථ කර නැති බවද නිරීක්ෂණය වේ. මෙම වැටලීම කළ ආකාරය සැක දනවන අතරම ඊට අදාළ විනය පරීක්ෂණ ගොනුව මේ වන විට අතුරුදන්ව තිබීම තවදුරටත් එම සැකය තහවුරු කරයි. ඉහත කරුණු සියල්ල සලකා බැලීමේ දී මෙම සේවය අහිමි කිරීමට අදාළව දෙපක්ෂයම සාධාරණව වගකීම් දරාගැනීම සුදුසු බවට තීරණය කරමි. දෙවන පාර්ශ්වය විසින් ඉදිරිපත් කර ඇති ලිඛිත සැළකිරීමේ දක්වා ඇති නෛතික තත්වයන්ට අදාළ පහත සඳහන් නඩු තීන්දු ද මෙහිදී සැළකිල්ලට ගත් බව විශේෂයෙන් සඳහන් කළ යුතුය.

01. Town council Bandarawela vs kaya (5NLR 236), Richard peris company VS wijesiriwardana (62 NLR 233)
02.Ceylon n state staff union vs Meddakasthara state 73 NLR 278
03.Sc appeal no. 37/99 Amarasinghe j - justice is not a one way street
04.Town council Bandarawela vs korowai.

ඒ අනුව අවසාන වශයෙන් සාධාරණව තීන්දු කල යුත්තේ දෙපක්ෂයටම සාධාරණව වගකීම් පැවරෙන අයුරින් බව නිරීක්ෂණය වේ. දෙපක්ෂයම සාධාරණව කටයුතු කර නොතිබීම සනාථ වී ඇති බැවිනි.

දෙපක්ෂයටම අදාළව කරුණු සලකා බැලීමෙන් පසුව පහත සඳහන් පරිදි කටයුතු කිරීම සාධාරණ සහ යුක්තිසහගත බවට තීරණය කරමි.

පළමු පක්ෂයේ පත්වීම් ලිපිය අනුව ඔහු විශ්‍රාම ගත යුතුව ඇත්තේ 2018.08.08 වන දිනයි. එදිනට ඔහුගේ වයස අවුරුදු 55 සම්පූර්ණ වේ. සේවය දීර්ඝ කිරීමට අදාළ කාලය ඔහුට අදාළ කර ගැනීමේ හැකියාවක් නැත. ඒ අනුව ඔහුගේ අවසන් අවස්ථාවේ ලද වැටුපට අනුව මූලික වැටුපෙන් 1/3 ක් බැගින් මාසිකව සේවය කිරීමට ඉතිරිව තිබූ වසර දහයට අදාළව ගණනය කර එකී මුදල පළමු පාර්ශ්වයට ප්‍රදානයක් වශයෙන් ලබාදීම සාධාරණ සහ යුක්ති සහගත බව තීන්දු කරමි.

ගණනය කිරීම

23000 x 12 x 10 x 1/3 = රු. 920000/-

රුපියල් නව ලක්ෂ විසිදාහක් (920000.00) ශ්‍රී ලංකාවේ වලංගු මුදලින් පළමු පාර්ශ්වය වන ආනන්ද සාගර යන අයට ගෙවීම මෙම ප්‍රදානය *රජයේ ගැසට් පත්‍රයේ* පළ වී වැඩ කරන දින 30 ක කාලයක් ඇතුලත දකුණු කොළඹ දිස්ත්‍රික් කම්කරු කාර්යාලයේ සහකාර කම්කරු කොමසාරිස් වෙත තැන්පත් කිරීමට වගඋත්තරකාර පාර්ශ්වයට නියම කරමි.

බේරුම්කරු
වී. ජයරත්න
2023.12.28

EOG 02-0014

මගේ අංකය: IR/COM/01/2015/186.

## කාර්මික ආරාවුල් පනත - 131 වන අධිකාරය

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2017.03.27 දිනැති හා අංක 2012/7 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට්* පත්‍රයේ ප්‍රසිද්ධ කරන ලද 2017.03.09 වැනි දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් 1. අගලවත්ත, උඩවෙල හි පදිංචි ජී.කේ. සුදත් කුමාර මහතා, 2. පෝරුවදණ්ඩ, මාපුටුගල, හොරහේන වෙන්දේසිවත්ත, මදරා හි පදිංචි එස්.වී.තුෂාරි ප්‍රියංගිකා, 3. කුරුණෑගල, වළාකුළුපොල පදිංචි නයනා දර්ශනී රාජපක්ෂ මිය, 4. පිළියන්දල, සිද්ධමුල්ල, ජනසවි මාවත, අංක. 28/21හි පදිංචි සඳකැළුම් ප්‍රභා ද සිල්වා මයා, 5. කුරුණෑගල, දොරටියාව, කෝන්පොල පාර, එවර්ග්‍රීන් ගාර්ඩින්, නො. 11 හි පදිංචි කේ.ඩබ්.එම්. චන්දිමා ප්‍රියදර්ශනී මිය සහ කොළඹ 02, වොක්සෝල් පටුමග, අංක. 55/75 හි පිහිටි තුරුසවිය අරමුදල අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත්කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති 2023.01.26 දිනැති ප්‍රදානය පළ කරනු ලැබූ 2023.03.22 දිනැති හා අංක 2324/27 දරන ගැසට් නිවේදනයේ දෝෂ නිවැරදි කිරීම සඳහා 2023.12.26 දිනැති සංශෝධිත ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

**එච්. කේ.කේ.ඒ. ජයසුන්දර,**
කම්කරු කොමසාරිස් ජනරාල් (රා.ආ.)

2024 ජනවාරි මස 19 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

**බේරුම්කිරීමේ අංශය හා කාර්මික අධිකරණය.**
**2023.03.22 දිනැති 2324/27 දරන ගැසට් නිවේදනය සංශෝධනය කිරීමයි.**

එක් පාර්ශ්වයක් වශයෙන්

නඩු අංකය :- A/16/2017
IR/COM/01/2015/186

1. ජී.කේ. සුදත් කුමාර මහතා,
   උඩවෙල, අගලවත්ත.

2. එස්.වී.තුෂාරි ප්‍රියංගිකා මිය,
   මදාරා,හොරහේන,
   වෙන්දේසිවත්ත,මාපුටුගල,
   පෝරුවදණ්ඩ.

3. නයනා දර්ශනී රාජපක්ෂ මිය,
   වළාකුළුපොල,
   කුරුණෑගල.

4. සඳකැළුම් ප්‍රභා ද සිල්වා මිය,
   අංක. 28/21,ජනසවි මාවත,
   සිද්ධමුල්ල,පිළියන්දල.

5. කේ. ඩබ්ලිව්. එම්. චන්දිමා ප්‍රියදර්ශනී මිය,
   නො. 11, එවර්ග්‍රීන් ගාර්ඩන්,
   කෝන්පොල පාර,දොරටියාව,
   කුරුණෑගල.

අනෙක් පාර්ශ්වය වශයෙන්

තුරුසවිය අරමුදල,
අංක. 55/75,
වොක්සෝල් පටුමග,
කොළඹ 02

**මුද්‍රණ පත්‍රයේ දෝෂ නිවැරදි කිරීම**

2023.03.02 දිනැති 2324/27 දරන ගැසට් නිවේදනය සංශෝධනය කිරිමයි,

ඉහත පාර්ශ්වයන් අතර ඇති කාර්මීක ආරාවුලට අදාළව මින් පෙර කරන ලද ප්‍රදානය සම්බන්ධයෙන් පහත සඳහන් කරුණු දැක්වීම සිදු කරමි.එම කාර්මික ආරවුලේදී සළකා බලන ලද්දේ ඉල්ලුම්කරුවන් පස් දෙනා ඔවුන් කොන්ත්‍රාත් පදනම යටතේ සේවයට බඳවා ගත් දින සිට හා / හෝ අදාළ අධ්‍යාපන සුදුසුකම් සම්පූර්ණ කළ දින සිට වැටුප් වර්ධක උපයා ගත්තා සේ සලකා වැටුප් තල වල පිහිටුවා ඔවුන්ගේ තනතුර පෙරදාතම් කර ස්ථිර කිරීමෙන් පසු එම වැටුප් පරිවර්තනය වැරදි ලෙස සිදු කර ඇතැයි දක්වා වැඩිපුර ගෙවන ලද වැටුප් අඩු කර වැටුප් ගෙවීම තුළින් ඉල්ලුම්කරුවන්ට අසාධාරණයක් සිදු වූවේද යන්නයි.
දෙපක්ෂයේ සාක්ෂි විමසීමෙන් මා තීරණය කරන ලද්දේ ඉල්ලුම්කරුවන්ට වැඩිපුර ගෙවන ලදැයි කියන වැටුප් ඔවුන්ගේ වැටුප් වලින් අඩු කිරීමෙන් ඔවුනට අසාධාරණයක් සිදු වී ඇති බවයි.

ඒ අනුව ඉල්ලුම්කරුවන් තිදෙනෙකු වන එස්.ටී.පී. ප්‍රියංගිකා, ජී.කේ.එන්. කුමාර හා නයනා දර්ශනී රාජපක්ෂ යන අයගෙන් වැඩිපුර ගෙවා ඇතැයි සඳහන් කර අය කර ගෙන ඇති මුදල රුපියල් දෙලක්ෂ තුන්සිය හැට හත (රු. 200,367.00)ක් බව සඳහන් වුවද ඒ එක් එක් අයගෙන් රුපියල් දෙලක්ෂ තුන්සිය හැට හත (රු. 200,367.00)ක් බැගින් අය කර ගෙන ඇත.එම නිසා ප්‍රදානයේ හරය වන්නේ වැඩිපුර ගෙවා ඇතැයි අයකර ගෙන ඇති මුදල් ඉල්ලුම්කරුවන්ගේ වැටුපෙන් අයකර ගැනීම යුක්ති සහගත නොවන බවයි.ඒ අනුව ඉහත නම් සඳහන් ඉල්ලුම්කරුවන් තිදෙනාගෙන් එක් එක් අයගෙන් රුපියල් දෙලක්ෂ තුන්සිය හැට හත (රු. 200,367.00)ක් බැගින් වූ මුදල ඔවුන් තිදෙනාට ගෙවන ලෙසත් ඉල්ලුම්කරුවන් දෙදෙනෙකු වන එන්.පී ද සිල්වා සහ චන්දිමා ප්‍රියදර්ශනී යන දෙදෙනාගෙන් අය කර ගෙන ඇත්තේ රුපියල් පනස් නව දහස් අටසිය හැත්තෑ එකයි ශත හැත්තෑ පහ (රු. 59871.75) බැගින් වූ මුදලක් ඒ අනුව එන්.පී ද සිල්වා යන අයගෙන් අයකර ගෙන ඇති රුපියල් පනස් නව දහස් අටසිය හැත්තෑ එකයි ශත හැත්තෑ පහ (රු. 59871.75) ක මුදල චන්දිමා ප්‍රියදර්ශනී යන අයගෙන් අය කර ගෙන ඇති රුපියල් පනස් නව දහස් අටසිය හැත්තෑ එකයි ශත හැත්තෑ පහ (රු. 59871.75) ක මුදල ද ඔවුනට ගෙවන ලෙසත් තීරණය කරමි.

තවද ප්‍රදානයේ සඳහන් ඉල්ලුම්කරුවන් පස්දෙනාගෙන් එක් එක් අයෙකුට රුපියල් විසි දහස (රු.20,000.00) බැගින් වූ වන්දි මුදල එලෙසම ගෙවිය යුතු බවත්, ඉල්ලුම්කරුවන්ගේ පත්වීම් ලිපි වල සඳහන් ආකාරයට ඔවුන්ට දිගටම වැටුප් ගෙවිය යුතු බවටත් දෙවන පාර්ශ්වයට නියම කරමි.

මෙම පැහැදිළි කිරීම අඩංගු ප්‍රදානය *ගැසට් පත්‍රයේ* පළ වූ දින සිට මසක් ඇතුළත සියලු මුදල දකුණු කොළඹ කම්කරු කාර්යාලයේ සහකාර කම්කරු කොමසාරිස් වෙත තැන්පත් කිරීමට දෙවන පාර්ශ්වයට නියම කරමි.මෙම කරුණු දැක්වීම සාධාරණ හා යුක්ති සහගත එකක් බව ප්‍රකාශ කරමි.තවද එම මුද්‍රණයේ ඇතුළත් අනෙකුත් කරුණුවල වෙනසක් නොමැති බව වැඩිදුරටත් ප්‍රකාශ කරමි.

බේරුම්කරු
(නීතීඥ සරත් ලියනගේ)

2023 දෙසැම්බර් 26 වැනි දින,

EOG 02-0015